## *4 වැනි පරිච්ඡේදය*

# මිල, වැටුප් සහ සේවා නියුක්තිය

### 4.1 සමස්ත නිරීක්ෂණ

- **විනිමය අනුපාත ස්ථායිතාව සමඟ දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ දේශීය නිෂ්පාදනය වර්ධනය වීම හේතු කොටගෙන, 2004 වර්ෂය මුල් කාලයේදී ආරම්භ වූ මිල මට්ටම් ඉහළ යාමේ නැඹුරුව 2005 වර්ෂයේදී පහත වැටීමට පටන් ගත්තේය**. කෙසේ වුවද, 2005 වර්ෂයේදී වාර්ෂික සාමාන්‍ය උද්ධමනය පහත වැටීමේ නැඹුරුවක් පෙන්වීය.[1] කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො. පා. මි. ද.) සහ ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ශ්‍රී ලංකා පා.මි.ද.), 2004 වසර අගදී වාර්තා කළ සියයට 7.6 ක් සහ සියයට 7.9 ක් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමන අගයන් සමඟ සැසඳීමේදී 2005 වසර අගදී පිළිවෙලින් සියයට 11.6 ක සහ සියයට 10.6 ක පමණ වූ ඉහළ අගයන් වාර්තා කළේය. සියලුම පාරිභෝගික මිල දර්ශකවල ලක්ෂ්‍යමය උද්ධමන පහත වැටීමක් වසර මුළුල්ලේම පෙන්වීය[2]. එසේ වුවද, දර්ශකවල ලක්ෂ්‍යමය වෙනස්වීම් 2004 වර්ෂයේ පළමු භාගය සමඟ සැසඳීමේදී 2005 වර්ෂයේ පළමු භාගයේදී සැලකිය යුතු ලෙස ඉහළ අගයන් වාර්තා කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය අවසාන වන විට පෙන්වූ උද්ධමනය පහත වැටීමේ නැඹුරුවට පෙර, වසරේ පළමු කාර්තු තුන තුළදී වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ඉහළ ගියේය. රටෙහි අනෙකුත් ප්‍රදේශ වලින් වාර්තා වූ උද්ධමන මිනුම් ද මීට සමාන රටාවන් පෙන්නුම් කෙරිණ.

- **තොග සහ සිල්ලර වෙළඳපොළ මිල මට්ටම්වල වෙනස්වීම් වලට, දේශීය මෙන් ම බාහිර ඉල්ලුම් සහ සැපයුම් සාධක බලපෑම් ඇති කරන ලදි**. භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය වැඩි වුවද, ඉහළ යන නිෂ්පාදන පිරිවැය සහ ප්‍රවාහන වියදම් මෙන්ම ඉන්ධන වැනි පාලිත මිලක් සහිත යෙදවුම් භාණ්ඩ මිල ගණන් ඉහළට සංශෝධනය කිරීම, සැපයුම් පාර්ශවයේ මිල ගණන් ඉහළ යාමට හේතු විය. පසුගිය වසරේ බල පෑ නියඟය නිසා ඇති වූ අහිතකර බලපෑම් හේතු කොටගෙන, 2005 වසරේ පළමු භාගය තුළදී ද සමහර දේශීය නිෂ්පාදිත කෘෂිකාර්මික ද්‍රව්‍යවල මිල පීඩනය ඉහළ මට්ටමක පැවතිණි. 2004 වර්ෂයේ දෙසැම්බර් 26 දින බලපෑ සුනාමි ව්‍යසනය ද මිල ගණන් කෙරෙහි අහිතකර බලපෑම් ඇති කිරීමට හේතු විය. එසේ වුවද විශේෂයෙන් වී වැනි කෘෂිකාර්මික නිෂ්පාදනවල පුළුල් ව්‍යාප්තිය හේතුකොට ගෙන වසරේ පළමු කාර්තුවෙන් පසුව මිල ගණන් කෙරෙහි වූ පීඩනය පහත වැටීමක් පෙන්නුම් කෙරිණ. වසර මුළුල්ලේ ම දක්නට ලැබුණු මූල්‍ය සහ ණය සමස්තයේ (විශේෂයෙන්ම පාරිභෝගික ණය) සාපේක්ෂ ලෙස ඉහළ යාම තුළින් ඉල්ලුම් පාර්ශවයෙන් මිල පීඩනයක් ඇති කළ අතර, දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය, 2005 වර්ෂය තුළදී උද්ධමන අපේක්ෂාවන් සීමා කිරීමට උපකාරී විය.


- **ආනයනික පාරිභෝගික භාණ්ඩ, මිශ්‍ර මිල විචලනයන් පෙන්නුම් කෙරිණ**. සහල්, සීනි සහ කිරිපිටි වැනි ප්‍රධාන පාරිභෝගික භාණ්ඩවල ආනයනික එ. ජ. ඩොලර් මිල ගණන් ඉහළ ගියේය. ඉල්ලුම් සහ සැපයුම් පාර්ශවයන්ගෙන් වූ උච්චාවචනයන් අඛණ්ඩව ඉහළ යාම හේතු කොටගෙන, ප්‍රධාන අන්තර් ආනයන භාණ්ඩ අතුරින් බොරතෙල් වල ජාත්‍යන්තර මිල ගණන් වසර පුරාම සාපේක්ෂව ඉහළ මට්ටමක විචලනය විය. එසේ වුවද, මෙලෙස ජාත්‍යන්තර තෙල් මිල ඉහළ

---

1. දෙන ලද ඕනෑම මාස 12 ක කාල පරිච්ඡේදයක් තුළදී ඊට පෙර මාස 12 ක කාල පරිච්ඡේදයට සාපේක්ෂව කිසියම් දර්ශකයක් මගින් මනිනු ලබන පොදු මිල මට්ටම්වල සාමාන්‍ය ප්‍රතිශත වෙනස, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය මගින් මනිනු ලැබේ.
2. දෙන ලද මාසයක මිල දර්ශකයේ අගය පසුගිය වසරේ එම මාසයේ අගයට සාපේක්ෂව වූ ප්‍රතිශත වෙනස ලක්ෂ්‍යමය උද්ධමනය මගින් මනිනු ලැබේ. කිසියම් මාසයක වාර්ෂික සාමාන්‍ය උද්ධමනයේ නැඹුරුව (දිශාව) එම මාසය තුළදී ලක්ෂ්‍යමය උද්ධමනය මගින් නිශ්චය කෙරේ. කිසියම් මාසයක ලක්ෂ්‍යමය උද්ධමනය පසුගිය වසරේ එම මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනයට වඩා වැඩිවේ නම් එම මාසයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය පසුගිය මාසයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනයට සාපේක්ෂව ඉහළ වීම සහ එහි ප්‍රතිලෝමය වේ.


**4.1 රූප සටහන**

**මිල දර්ශකවල උපනතීන්**




**4.2 රූප සටහන**

**මිල දර්ශකවල ලක්ෂ්‍යමය වෙනස්වීම්**



**4.1 සංඛ්‍යා සටහන**
**මිල දර්ශකවල වෙනස්වීම්**

| දර්ශකය | දර්ශකයේ සාමාන්‍යය | | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 2003 | 2004 | 2005 | දෙසැ. 2004/දෙසැ. 2003 | දෙසැ. 2005/දෙසැ. 2004 | 2004/2003 | 2005/2004 |
| කො.පා.මි.ද. | 3,377.0 | 3,632.8 | 4,055.5 | 13.8 | 8.0 | 7.6 | 11.6 |
| කො.දි.පා.මි.ද. | 141.4 | 148.5 | 163.1 | 12.6 | 4.3 | 5.0 | 9.8 |
| අනුරාධපුර පා.මි.ද. | 146.6 | 158.5 | 172.8 | 15.3 | 3.4 | 8.1 | 9.0 |
| මාතලේ පා.මි.ද. | 142.1 | 151.6 | 166.6 | 13.5 | 4.6 | 6.7 | 9.9 |
| මාතර පා.මි.ද. | 137.3 | 147.2 | 157.2 | 13.6 | 2.1 | 7.2 | 6.8 |
| ශ්‍රී ලංකා පා.මි.ද. | 158.4 | 170.9 | 189.1 | 16.8 | 3.6 | 7.9 | 10.6 |
| තොග මි.ද. | 1,679.1 | 1,889.0 | 2,105.9 | 23.9 | 1.7 | 12.5 | 11.5 |
| ද.දේ.නි. අවධමනකය | 168.0 | 183.6 | 201.8 | - | - | 9.3 | 9.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යාමෙන් වූ සම්පූර්ණ බලපෑම දේශීය තෙල් මිල ගණන් මගින් පෙන්නුම් නොකරන ලදි. මීට ප්‍රතිවිරුද්ධව යමින් 2004 වර්ෂයට සාපේක්ෂව තිරිඟු ඇටවල ජාත්‍යන්තර මිල ගණන් පහත වැටීමක් වාර්තා කරන ලදි. මේ අතර, ප්‍රධාන ගනුදෙනු ව්‍යවහාර මුදල් වන එ. ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි ආන්තික විචලනය, ආනයන මිල කෙරෙහි විනිමය අනුපාතික වලින් වන බලපෑම පහළ මට්ටමක පවත්වා ගැනීමට සමත් විය.

- **පාලන ක්‍රියාමාර්ග තුළින් ඉහළ යන ආනයනික පිරිවැය මගින් වන බලපෑම අඩු කිරීමට උත්සාහ දැරීම. මිල පීඩනය කිසියම් ප්‍රමාණයකින් අඩු මට්ටමක පවත්වා ගැනීමට උපකාරී විය.** තෝරාගත් ප්‍රධාන අයිතම කීපයක (ඩීසල්, එල්. පී. ගෑස් සහ කිරිපිටි) සඳහා වූ එකතු කළ අගය මත වන බද්ද (VAT) ඉවත් කිරීම සහ සීමිත සංශෝධන මගින් ඉහළ යන නිෂ්පාදන පිරිවැයට වඩා පහළ මට්ටමක දේශීය පෙට්‍රෝලියම් නිෂ්පාදන මිල පවත්වා ගැනීම තුළින්, කිසියම් ප්‍රමාණයකට මිල ගණන් දැරීය හැකිවීම හේතුකොට ගෙන පාරිභෝගිකයන්ට තාවකාලිකව මිල සහනයක් සලසන ලදි.

- **2004 වසර අගදී සිදු වූ වැටුප් සංශෝධනයන් හේතුකොට ගෙන, 2005 වර්ෂයේදී රාජ්‍ය අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් ඉහළ ගිය අතර පෞද්ගලික අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් පහත වැටීමක් සිදුවිය.** උද්ධමනය හා ගැලපූ විට රාජ්‍ය අංශයේ විධායක නොවන නිලධාරීන්ගේ නාමික වැටුප් වැඩිවීම සියයට 14 සිට සියයට 18 අතර පරාසයක විය. මෙලෙස රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීම හේතුවෙන්, 'සේවකයින්ගේ අයවැය සහන දීමනාව පනතට' යටත්ව පෞද්ගලික අංශයේ සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමට බලපෑම් ඇති කරන ලදි. උද්ධමනය සමඟ ගැලපීමට තරම් ප්‍රමාණවත් නොවූවද, අසංවිධිත පෞද්ගලික අංශයේ සේවකයින්ගේ නාමික වේතන සහ සංවිධිත පෞද්ගලික අංශයේ සේවකයින්ගේ අවම නාමික වේතන ඉහළ යාමක් වාර්තා විය. ඉහළ යන ඉල්ලුම තුළින් පාරිභෝගික මිල ගණන් කෙරෙහි යම් ප්‍රමාණයක පීඩනයක් ඇති කිරීමට මෙලෙස වැටුප් වැඩිවීම හේතු වන්නට ඇත.

- **2004 වර්ෂයේදී සියයට 8.3 ක් වූ සේවාවියුක්තිය, 2005 අගෝස්තු වන විට සියයට 7.7 දක්වා පහත වැටුණි.** ආර්ථික කටයුතුවල සිදුවූ ප්‍රසාරණය සහ රජයේ උපාධිධාරී රැකියා වැඩසටහන ක්‍රියාත්මක කිරීම, සේවා වියුක්ති මට්ටමේ පහළයාමට හේතුවිය. සුනාමියෙන් හානියට පත් වූ මුහුදු බඩ ප්‍රදේශවල හෝටල්, ධීවර සහ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත උප අංශවල පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණත්, සුනාමි නැවත ඉදිකිරීමේ කටයුතුද ඇතුළත් ඉදිකිරීම් අංශයේ සිදුවූ වර්ධනයත් 2005 වර්ෂය තුළ රැකියා අවස්ථා ජනනය වීමට උපකාරී විය.

- **2004 සිට 2005 වර්ෂය දක්වා ආර්ථිකයේ විවිධ අංශයන් අතර සේවකයින් විතැන්වීම, ශ්‍රම සංචලතාවයේ ඉහළ යාමට හේතුවිය.** කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය ඉහළ ගොස් තිබුණද, එම අංශයේ සේවා නියුක්තිය පහළ ගිය අතර, ඉදිකිරීම් හා නිමැවුම් අංශ මගින් එය අවශෝෂණය කරගන්නා ලදි. අනෙක් අතට මෙම අවශෝෂණය තුළින් එම අංශවල ආර්ථික කාර්යයන් ප්‍රසාරණය විය.

- **2005 වර්ෂයේ දී විදේශීය රැකියා අවස්ථාවන් 2004 වර්ෂය හා සැසඳීමේදී සියයට 8.2 කින් වැඩිවී ඇත.** විදේශ රැකියා අවස්ථා තුළ පුරුෂ අංශයේ දයකත්වය පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ ගොස් ඇත. මිනිස් බල කාණ්ඩවල ගෘහ සේවිකාවන්ගේ දයකත්වයද ඉහළ මට්ටමක පැවතුණි. 2005 වර්ෂයේ විදේශ ශ්‍රමිකයින් සඳහා ඇති ඉල්ලුම ප්‍රධාන වශයෙන් කටාර්, සෞදි අරාබිය හා එක්සත් අරාබි එමීර් රාජ්‍යයන්ගෙන් විය.

- **2005 වර්ෂය තුළදී ශ්‍රම වෙළඳපොළ සුමට ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීමේ අරමුණින්, කම්කරු නීති සංශෝධනය කිරීමත් ඒවා නව පනත් ලෙස පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමත් කරන ලද අතර වතු වැවිලි අංශය තුළ සාමූහික ගිවිසුම් ආවරණයද ව්‍යාප්ත කරන ලැබිය.** 2005 වර්ෂයේදී වැටුප් ගිවිසුම් යටතේ වූ සාමූහික කේවල් කිරීමේ අයිතිය තුළින් හටගත් සේව්‍ය සේවක සබඳතාවල දියුණුව නිසා වතු වැවිලි අංශයේ වැඩ වර්ජන සංඛ්‍යාව 2004 වර්ෂයට සාපේක්ෂව සැළකිය යුතු ලෙස අඩුවිය.

## 4.2 මිල

### පාරිභෝගික මිල දර්ශක (පා.මි.ද.)

- **සියලුම පාරිභෝගික මිල දර්ශකයන්ගේ වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාත පසුගිය වසර අවසානයේදී පැවති සියයට 5 සිට 8 අතර පරාසය සමග සැසඳීමේදී මේ වසර අවසානයේදී සියයට 7 සිට 12 අතර පරාසයක වාර්තා විය**. 2004 වර්ෂය මුල් කාලයේ සිට 2005 වසර මැද භාගය දක්වා වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතයන් අඛණ්ඩව ඉහළ ගිය අතර ඉන්පසු ක්‍රම ක්‍රමයෙන් පහත වැටීම තුළින් වසර අවසානය වන විට උද්ධමනය සමනය වීමක් පෙන්නුම් කෙරිණ. දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් වසරේ පළමු කාර්තුව තුළදී පහත වැටීම ආරම්භ වී ඉතිරි කාලය තුළදී ද අඛණ්ඩව පහත වැටීමේ නැඹුරුව තුළින් මෙම තත්ත්වය පෙන්නුම් කෙරිණ. කෙසේ වුවද, වසරේ පළමු භාගය තුළදී වාර්තා වූ මෙම ලක්ෂ්‍යමය වෙනස්වීම් පසුගිය වසරේ අනුරූප වෙනස්වීම් සමග සැසඳීමේදී ඉහළ අගයන් ගත්තා ලදී. වසරේ දෙවන භාගයේදී මෙම තත්ත්වය වෙනස් වූ අතර විශේෂයෙන්ම තුන්වන කාර්තුවේ සිට බොහෝ පාරිභෝගික මිල දර්ශකයන්ගේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පසුගිය වසරට සාපේක්ෂව අඩු අගයන් වාර්තා කිරීම තුළින් වසර අවසාන වනවිට මිල පීඩනය සමනය වීමක් පෙන්නුම් කෙරිණ.

- **දේශීය මෙන්ම ආනයන භාණ්ඩයන්ගේ මිල විචලනයන්, පාරිභෝගික මිල දර්ශකයන්ගේ හැසිරීම් කෙරෙහි බලපෑම් ඇති කරන ලදී**. කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ භාණ්ඩ පැසෙහි දේශීයව නිෂ්පාදිත භාණ්ඩ සඳහා සියයට 78 පමණ නියෝජනයක් ඇති අතර, ඉතිරි සියයට 22 ආනයන භාණ්ඩ මගින් නියෝජනය කෙරේ. මෙම කාණ්ඩ දෙකෙහිම වැඩි වශයෙන් ඇතුළත් වන්නේ ආහාර අයිතමයන්ය. මෙයට සමාන සංයුතියක් අනෙකුත් පාරිභෝගික මිල දර්ශකයන්හි ද පෙන්නුම් කරයි. ඒ අනුව, පාරිභෝගික මිල දර්ශකයන්ගේ නිරීක්ෂිත හැසිරීම් කෙරෙහි බලපෑමක් ඇති කරන ප්‍රධාන සාධකය වන්නේ ආහාර ද්‍රව්‍ය වල මිල ගණන් වෙනස් වීමය. වසර තුළදී සමස්ත පාරිභෝගික මිල දර්ශකයන්ගේ ලක්ෂ්‍යමය වෙනස් වීම් අදාළ ආහාර උප දර්ශකයන්ගේ වෙනස්වීම් වලට සමාන රටාවන් අනුගමනය කරන ලදී. මේ අතර, ඉන්ධන සහ ආලෝකය උප කාණ්ඩයන්හි (සමස්ත දර්ශකයන් හි මුළු බරතැබීම් වලින් සියයට 4-6 පරාසයක නියෝජනයක් සහිත) අයිතමයන්ගේ මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම, සමස්ත පාරිභෝගික මිල දර්ශකයන්ගේ ලක්ෂ්‍යමය වෙනස් වීම් වලට මෙන්ම වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාත වෙනස් වීම් වලටද දයක විය.

- **ජීවන වියදම මැනීමේ නිල මිණුම වන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ඉහළ යාමේ නැඹුරුව අඛණ්ඩව පැවතෙමින් 2005 වසරේ අගෝස්තු මාසය වනවිට සියයට 12.8 කරා ළඟා වූ අතර ඉන්පසුව ක්‍රමයෙන් අඩුවීමට පටන් ගෙන වසර අවසාන වනවිට සියයට 11.6 ක් කරා ළඟා විය**. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ භාණ්ඩ පැස තුළ සියයට 62 ක ඉහළම නියෝජනයක් ඇති ආහාර උපදර්ශකය මීට සමාන රටාවක් අනුගමනය කළ අතර, රෙදිපිළි, ඉන්ධන සහ ආලෝකය සහ විවිධ අයිතම යන අනෙකුත් උප දර්ශකයන්ගේ උද්ධමන අනුපාතයන් වසර පුරාම ඉහළ යාමේ නැඹුරුවක් පෙන්වීය. භූමිතෙල්, දර, ගිනිකූරු සහ විදුලිය යන අයිතමයන්හි මිල මට්ටම් වෙනස්වීම මනිනු ලබන ඉන්ධන සහ ආලෝකය උප දර්ශකයේ (කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ භාණ්ඩ පැස තුළ සියයට 4.3 ක බර තැබීමක් ඇති) වාර්ෂික සාමාන්‍ය උද්ධමනය වසර අවසානයේදී සියයට 13.5 ක් පමණ විය. විවිධ භාණ්ඩ උපකාණ්ඩයේ අයිතමයන් අතරින්, ප්‍රවාහනය හා සම්බන්ධ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළට සංශෝධනය කිරීම, දුම්කොළ හා මත්පැන් මිල ගණන් සහ උපකාරක පන්ති ගාස්තු මෙන්ම ලිපි ද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම හේතු කොට ගෙන 2005 වසරේ ජනවාරි මාසයේදී සියයට 6.5 ක් පමණ වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය වසරේ දෙසැම්බර් මාසය වන විට සියයට 10 ක් කරා ළඟා විය. කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැස තුළ සියයට 18 ක් පමණ නියෝජනය කරමින් දෙවන ස්ථානය හිමිකරගෙන ඇති මෙම උපදර්ශකයේ වෙනස් වීම් ද සමස්ත දර්ශකයේ හැසිරීම කෙරෙහි සැලකිය යුතු විශාල බලපෑමක් ඇති කරන ලදී.

- **ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයද, කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට සමාන හැසිරීම් රටාවක් පෙන්නුම් කළ නමුදු, කො.පා.මි.ද සමග සැසඳීමේදී උද්ධමනය වෙනස් වීමේ තීව්‍රතාවය ඉහළ මට්ටමක පැවතිණ**. ශ්‍රී ලංකා පා.මි. දර්ශකය වඩා කාලීන පාරිභෝගික භාණ්ඩ පැසක් සහිත (පදනම් වර්ෂ 1995/97) වනවා මෙන්ම, උතුරු සහ නැගෙනහිර පළාත් හැර රටෙහි මුළු ජනගහනයේ වියදම් කාණ්ඩයන්ගෙන් අවම සියයට 80 කාණ්ඩයේ වියදම් රටාව නියෝජනය කරමින් වඩා වැඩි ආවරණයක් සහිත වේ. දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය අඛණ්ඩව ඉහළ ගිය අතර ජූලි මාසය වනවිට සියයට 14.5 ක පමණ වූ ඉහළම අගය වාර්තා කර ඉන්පසුව උද්ධමනය පහත වැටීමක් ආරම්භ වී වර්ෂය අවසාන වන විට සියයට 10.6 ක් කරා ළඟා විය. මෙම වෙනස් වීම් පසුගිය වසරේ උද්ධමන අනුපාතික පරාසය වූ සියයට 1.2 සිට 7.9 අතර පරාසය සමග සැසඳේ. ශ්‍රී ලංකා පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙන් සියයට 71 ක පමණ නියෝජනයක් ඇති ආහාර, බීම සහ දුම්කොළ උපදර්ශකය මගින් සමස්ත දර්ශකයට ප්‍රධාන බලපෑමක් සිදුකෙරෙන අතර මෙම උපදර්ශකයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය පසුගිය වසරේ සියයට -1 සිට 8 අතර පරාසයක පැවති අතර 2005 වසරේදී එය සියයට 10.1 සහ 16.8 අතර පරාසයක වෙනස් විය. ප්‍රවාහන සහ නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩවල මිල මට්ටම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ජාත්‍යන්තර වෙළඳපොලෙහි අඛණ්ඩව තෙල් මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස

දේශීය ඉන්ධන මිල ගණන් ඉහළට සංශෝධනය කිරීමයි. පසුගිය වසරේදී සියයට 10.8 ට සාපේක්ෂව ප්‍රවාහන උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම මේ වසරේදී සියයට 17 ක් පමණ විය. සමස්ත දර්ශකයේ සියයට 13 ක පමණ බරතැබීමක් සහිත නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උපදර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2004 දී වූ සියයට 5.8 ට සාපේක්ෂව 2005 දී සියයට 14.6 ක් ලෙස වාර්තා විය. ඉන්ධන සහ ගෑස් මිල ඉහළ යාමට අමතරව ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහළ යාම සහ ජල ඒකකයක් සඳහා වූ ගාස්තු ඉහළට සංශෝධනය කිරීම, මෙම උපදර්ශකයේ වාර්තා වූ ඉහළ උද්ධමනයට දායක විය. ඉදිකිරීම්, පුහුණු සහ සංවර්ධන ආයතනය (ICTAD) මගින් සකස් කරන ලද සමස්ත ඉදිකිරීම් දර්ශකයේ ඉහළ අගයන් තුළින්ද ගොඩනැගිලි ද්‍රව්‍යයන්හි මිල ඉහළයාම ප්‍රත්‍යක්ෂ කෙරිණ. ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ අනෙකුත් උපදර්ශකයන් අතුරින්, සෞඛ්‍යය, අධ්‍යාපන සහ විවිධ භාණ්ඩ හා සේවා උපදර්ශකයන් වර්ෂය තුළදී උද්ධමන ඉහළ යාමේ නැඹුරුවක් පෙන්නුම් කළේය. දර්ශකයේ සියයට 4 ක බැර තැබීමක් සහිත රෙදිපිළි සහ පාවහන් උපදර්ශකය, පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 5 ක වාර්ෂික සාමාන්‍ය උද්ධමනයට සාපේක්ෂව සියයට 4 කට වඩා අඩු අගයක් පෙන්නුම් කළේය. විවේකය, විනෝදය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ උපදර්ශකය 2005 වර්ෂයේදී සියයට 17.5 ක පමණ සැලකිය යුතු තරම් වාර්ෂික සාමාන්‍ය උද්ධමනයක් පෙන්නුම් කළ නමුදු, ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ භාණ්ඩ පැස තුළ මෙම කාණ්ඩය සඳහා වූ බර තැබීම සියයට 1 කට අඩු බැවින්, සමස්ත දර්ශකයේ උද්ධමනය කෙරෙහි ඇති වූයේ ආන්තික බලපෑමකි.

**ප්‍රාදේශීය මිල දර්ශකයන්**

- **කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය සහ ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය මගින් මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමනයන්හි සාමාන්‍ය හැසිරීම් රටාවට සමාන රටාවක් සියලුම ප්‍රාදේශීය මිල දර්ශකයන් මගින්ද පෙන්නුම් කෙරිණ.** කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය සහ ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුරාධපුරය (අනුරාධපුර පා.මි.ද.), කොළඹ (කොළඹ දි.පා.මි.ද.) මාතලේ (මාතලේ පා.මි.ද.) සහ මාතර (මාතර පා.මි.ද.) යන දිස්ත්‍රික්ක සඳහා සකස් කරනු ලබන මිල දර්ශකවල හැසිරීම් තුළින් ප්‍රාදේශීය වශයෙන් උද්ධමනයන් මනිනු ලබයි. දිස්ත්‍රික්කවල කුටුම්භ පරිභෝජන රටාවේ පවතින වෙනස්කම් නිරූපණය කෙරෙන දර්ශකවල බර තැබීම් ව්‍යුහයේ ඇති වෙනස්කම් සහ රටෙහි විවිධ ප්‍රදේශ අතර මිල ගණන් වල හැසිරීම් පෙන්නුම් කරමින් ප්‍රාදේශීය මිල දර්ශකවල ලක්ෂ්‍යමය වෙනස් වීම්, කො.පා.මි. සාපේක්ෂව ආන්තික වශයෙන් වෙනස් අගයන් ගත්තේය. ලක්ෂ්‍යමය වෙනස්වීම් එකසමාන උපනතීන් පෙන්නුම් කළ අතර පසුගිය වසරේ අනුරූප මාස සමග සැසඳීමේදී මේ වසරේ මුල් මාස හය තුළදී සැලකිය යුතු මට්ටමක ඉහළ අගයන් වාර්තා කළ අතර අවසාන මාස හය තුළදී විශාල ලෙස පහත වැටුණි. කෙසේ වුවද, වසරේ වැඩි කාලයක් සඳහා දිස්ත්‍රික්ක හතරේ මිල දර්ශක වලින් පෙන්නුම් කළ උද්ධමනයන් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන් සහ ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන් පෙන්නුම් කළ උද්ධමනයන්ට වඩා අඩු අගයන් ගත්තේය. වසර අවසාන වනවිට දිස්ත්‍රික් මිල දර්ශක වාර්තා කළ වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතයන් සියයට 10 ට වඩා අඩු වූ අතර, කොළඹ නාගරික බල ප්‍රදේශය (කො.පා.මි.ද) සහ සමස්ත දිවයින (ශ්‍රී ලංකා පා.මි.ද) සියයට 10 ට වඩා වැඩි උද්ධමන අනුපාතයන් වාර්තා කළේය. වසරේ මාස හතක් සඳහාම මාසික වෙනස් වීම් අවනතීන් (ඍණ අගයන්) වාර්තා කරමින් මාතර දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස් වීම මෙන්ම වාර්ෂික සාමාන්‍ය උද්ධමනයද අවම අගයක් පෙන්වීය. කෘෂිකාර්මික අංශය ප්‍රකෘති තත්ත්වයට පත්වීමත් සමගම විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකය තුළ ඉහළ නියෝජනයක් ඇති සහල් මිල පහත වැටීම, මෙම දිස්ත්‍රික්කය සඳහා උද්ධමන අනුපාතිකය අඩු අගයක් වාර්තා කිරීමට හේතු වන්නට ඇත.

- **අනුරාධපුර, මාතලේ සහ මාතර දිස්ත්‍රික්කයන් හි උද්ධමන අනුපාතයන් පසුගිය වර්ෂය අවසාන වනවිට කොළඹ දිස්ත්‍රික්කයේ පැවති අනුපාතයට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවති නමුත් 2005 වර්ෂය අවසානයේදී මෙම අනුපාතයන් සැලකිය යුතු ප්‍රමාණයකට එක් අගයක් දෙසට ළඟා වීමක් මෙන්ම අනුරාධපුර සහ මාතර දිස්ත්‍රික්ක, කොළඹ දිස්ත්‍රික්කයට වඩා අඩු උද්ධමන අනුපාතයන් වාර්තා කරන ලදී.** කෘෂි නිෂ්පාදිත ප්‍රදේශ වූ බැවින් කොළඹ දිස්ත්‍රික්කයට වඩා අඩු මිලකට ප්‍රධාන කෘෂි නිෂ්පාදනයන් වෙළඳ පොළෙන් ලබාගත හැකිවීම, මෙම දිස්ත්‍රික්ක තුනෙහි උද්ධමනයන් වසරේදී වඩා වැඩි වේගයකින් පහළ වැටීමට හේතු වන්නට ඇත. මෙම අයිතමයන් අතර වී මිල පහළ යාම සැලකිය යුතු තරම් විය. අඩු වී නිෂ්පාදනය සහ මෙට්‍රික් ටොන් 221,663 ක පමණ ආනයනික සහල් මත යැපීමට සිදුවීම සහ එම සහල් කොළඹින් පිට පලාත්වලට බෙදහැරීමේ දී දැරීමට සිදුවන අමතර ප්‍රවාහන වියදම් යන කරුණු පසුගිය වසරේදී ප්‍රාදේශීය මිල දර්ශකවල සහ ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ උද්ධමන අගයන්, කොළඹ දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකයේ උද්ධමනය සමග සැසඳීමේදී වඩා ඉහළ අගයන් ගැනීමට හේතුවිය. ප්‍රාදේශීය මිල දර්ශකයන්හි පැස තුළ සැලකිය යුතු දායකත්වයක් ඇති සහල් මිල, මෙම ප්‍රදේශවල වී නිෂ්පාදනය වැඩි වීමත් සමග පහත වැටීම 2005 වර්ෂයේදී සිදුවූ ඉහත මිල සංවර්ධනයන්ට දායක විය.

**තොග මිල දර්ශකය (තො.මි.ද.)**

- **2004 හා 2005 වර්ෂ දෙකෙහිදී ම දක්නට ලැබුණු තොග මිල දර්ශකයේ හැසිරීම, සිල්ලර මට්ටමේ මිල ප්‍රවර්ධනයන් ඉදිරියට ගෙන යාමක් විය**. අනාගත සිල්ලර මිල වෙනස් වීම පෙන්නුම් කෙරෙන ප්‍රධාන දර්ශකයක් ලෙස තොග මිල දර්ශකය හැසිරෙන බව පාරිභෝගික මිල දර්ශකවල හැසිරීම් මගින් පෙන්නුම් කෙරේ. නිදසුනක් ලෙස, තොග මිල දර්ශකය 2004 පෙබරවාරි මුල සිටම ඉහළ යාම ආරම්භ වී 2005 ජුනි දක්වාම අඛණ්ඩව ඉහළ ගිය අතර එම තත්ත්වය පාරිභෝගික මිල දර්ශකයන් මගින් මනිනු ලැබූ වාර්ෂික සාමාන්‍ය උද්ධමන ඉහළ යාම, 2004 වර්ෂයේ දෙවන කාර්තුවේදී ආරම්භ වී 2005 අගෝස්තු දක්වා අඛණ්ඩව පැවතීමෙන් පිළිබිඹු වේ. තොග මිල දර්ශකයේ භාණ්ඩ පැස තුළ සියයට 68 ක පමණ වූ බරතැබීමක් සහිත ආහාර උපදර්ශකයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 10-22 අතර පරාසයක විචලනය වෙමින් සමස්ත දර්ශකයේ වෙනස් වීමට සමාන රටාවක් පෙන්නුම් කළේය. වසර ආරම්භයේදී තොග මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් අනෙකුත් සියලුම පාරිභෝගික මිල දර්ශකයන්ගේ ලක්ෂ්‍යමය වෙනස් වීම් වලට වඩා ඉහළ අගයක පැවතුණි. නමුත් වසර අවසානය වන විට තියුණු ලෙස පහත වැටී සියයට 2 ක අගයක් කරා ළඟා විය. මෙමගින් සියලුම පාරිභෝගික මිල දර්ශකයන්ගෙන් පෙන්නුම් කෙරෙනු ලැබූ සිල්ලර මිල හැසිරීම් තහවුරු කෙරේ.

- **ඇතැම් ප්‍රධාන අන්තර් සහ අයෝජන භාණ්ඩවල මිල ඉහළයාමද, අදාළ උපදර්ශකයන්ගේ හැසිරීම් රටාවට බලපෑම් ඇති කරන ලදී**. ජාත්‍යන්තර වෙළඳපොලෙහි බොරතෙල් මිල ඉහළ යාම සහ එයින් පසුව සිදුවූ දේශීය ඉන්ධන මිලෙහි ගැලපුම් තත්ත්වයන් හේතු කොටගෙන මුළු දර්ශකයෙන් සියයට 6 ක පමණ දෙවෙනි ප්‍රධාන බරතැබීමක් සහිත පෙට්‍රෝලියම් නිෂ්පාදිත උපදර්ශකය, 2004 වසරේදී වූ සියයට 15 ක පමණ උද්ධමනයට සාපේක්ෂව 2005 වසරේ දී සියයට 23 ක පමණ උද්ධමන අනුපාතයක් වාර්තා කළේය. බොහෝ ගොඩනැගිලි ද්‍රව්‍යයන්හි විශේෂයෙන්ම සිමෙන්ති, ගඩොල්, වීදුරු තහඩු සහ උළු යනාදියෙහි මිල ඉහළ යාම, ලෝහ නොවන නිෂ්පාදිත උපදර්ශකයේ හැසිරීම මගින් පෙන්නුම් කෙරිණි. මෙම උපදර්ශකයේ ලක්ෂ්‍යමය වැඩිවීම 2005 ජුනි මාසය වනවිට එහි ඉහළම අගය වූ සියයට 69 ට සාපේක්ෂව ගත්කළ පසුගිය වසරේ එම මාසයේදී සියයට 6 ක් පමණ විය. එසේම, උප දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස 2005 වර්ෂයේ සෑම මාසයක් සඳහාම සියයට 30 කට වැඩි අගයන් වාර්තා කරන ලදී. ඒ අනුව ලෝහ නොවන නිෂ්පාදිත උපදර්ශකයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2004 වර්ෂයේදී වාර්තා වූ සියයට 16 ට සාපේක්ෂව 2005 වර්ෂයේදී සියයට 45 ක් කරා ළඟා විය. ඉහළ ආනයන පිරිවැය සහ දේශීය නිෂ්පාදන සඳහා වන යෙදවුම් පිරිවැය ඉහළ යාමට අමතරව ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනයේදී දැරීමට සිදුවන ඉහළ පිරිවැයද මෙම තත්ත්වයට දයක විය. රෙදිපිළි සහ පාවහන් මිල ගණන් පසුගිය වසරේ පැවතුණු මිල මට්ටම් වලට සමානව තරමක් ස්ථාවර තත්ත්වයක පැවතීම තොග මිල දර්ශකයේ අදළ උපදර්ශකයෙන් පෙන්නුම් කරනු ලැබූ අතර, මෙයට අනුරූපී හැසිරීම් රටාවක් පා.මි. දර්ශකයන්හි අදල උපදර්ශක මගින්ද නිරූපනය විය. ප්‍රවාහන උපකරණ උපදර්ශකයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය පසුගිය වසරේ පැවති සියයට 6 කට සාපේක්ෂව මෙම වසරේදී සියයට 14 ක් විය. ප්‍රවාහන උපකරණ සහ පෙට්‍රෝලියම් නිෂ්පාදනවල මිල වැඩිවීම්වල සංයුක්ත බලපෑම, සියලුම පාරිභෝගික මිල දර්ශකයන්හි ප්‍රවාහන උපදර්ශකවල ඉහළ යාමෙන් පෙන්නුම් කෙරිණි.

- **භාණ්ඩවල ප්‍රභවය පදනම් කොටගෙන කරනු ලබන වර්ගීකරණ යටතේ ආනයන සහ අපනයන භාණ්ඩ උපදර්ශක, දේශීය නිෂ්පාදිත උප දර්ශකයට වඩා ඉහළ වැඩිවීමක් වාර්තා කළේය**. සියයට 50 කට වඩා වැඩි නියෝජනයක් සහිත සහ ආහාර අයිතමයන්ගෙන් වැඩි බලපෑමක් ඇති දේශීය භාණ්ඩ උප දර්ශකය, පසුගිය වසරේ වාර්තා කළ සියයට 10 ට සාපේක්ෂව අඩුවීමක් එනම්, සියයට 7 ක වාර්ෂික සාමාන්‍ය උද්ධමනයක් වාර්තා කළේය. දේශීය භාණ්ඩවල සිල්ලර මිල, 2006 වසරේ මුල් මාස කිහිපය තුළදී 2005 වසරේ අදළ කාල සීමාවට සාපේක්ෂව ස්වල්ප වශයෙන් අඩුවිය හැකි බවක් මෙමගින් පෙන්නුම් කෙරේ. තොග මිල දර්ශකයේ භාණ්ඩ පැස තුළ සියයට 27 ක පමණ බර තැබීමක් ඇති ආනයන භාණ්ඩ උප කාණ්ඩය, පසුගිය වසරේ වාර්තා කළ සියයට 10 ක පමණ මිල මට්ටම් ඉහළ යාමට සාපේක්ෂව මේ වසරේදී සියයට 18 ක පමණ මිල මට්ටම් ඉහළ යාමක් වාර්තා කළේය. පෙට්‍රෝලියම් නිෂ්පාදන, එල්.පී.ගෑස් සහ පොහොර වැනි අතරමැදි ආනයන භාණ්ඩ වල ඉහළ ජාත්‍යන්තර මිල ගණන් ආනයන මිල උපදර්ශකය ඉහළ යාම කෙරෙහි දයක වූ ප්‍රධාන සාධක විය. තොග මිල දර්ශකයේ සියයට 22 ක බර තැබීමක් සහිත අපනයන උපදර්ශකය, 2005 වසර තුළදී සියයට 12 ක වාර්ෂික සාමාන්‍ය උද්ධමනයක් වාර්තා කළේය. තොග මිල දර්ශකයේ සියයට 11 ක නියෝජනයක් ඇති තේ සඳහා පැවති ආකර්ශනීය මිල ගණන් අපනයන උපදර්ශකය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. මැදි බිම් සහ පහත් බිම් තේ වල උසස් තත්ත්වයන් හේතුකොට ගෙන ඒවායේ අපනයන මිල ගණන් පසුගිය වසර වලට වඩා පිළිවෙලින් සියයට 3 ක සහ සියයට 5 ක වර්ධනයන් පෙන්වීය. ජාත්‍යන්තර වෙළඳ පොළෙහි කෘත්‍රිම රබර් සඳහා ඉහළ මිල ගණන් පැවතීමේ ප්‍රතිඵලයන් ලෙස ස්වාභාවික රබර් අපනයන මිල සියයට 11 කින් පමණ වර්ධනය වීමද අපනයන මිල උපදර්ශකයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනයට දයක විය.

- **භාවිතය අනුව භාණ්ඩ වර්ගීකරණය යටතේ වූ උපදර්ශක තුනම ඉහළ යාමක් වාර්තා කළ අතර, ආයෝජන භාණ්ඩ උපදර්ශකය වැඩිම අනුපාතයකින් ඉහළ ගියේය**. තොග මිල දර්ශකයේ වියදම් පැසෙහි

සියයට 75 කට වඩා වැඩි නියෝජනයක් සහිත සහ වැඩි වශයෙන් ආහාර ද්‍රව්‍යවලින් සමන්විත පාරිභෝගික භාණ්ඩ උපදර්ශකය පසුගිය වසරට සාපේක්‍ෂව සියයට 10 කින් පමණ ඉහළ ගියේය. මෙම උපදර්ශකයේ මාස 12 ක සාමාන්‍ය වැඩිවීම්, වසරේ ප්‍රථම භාගයේ මාස සඳහා වාර්තා කළ සැලකිය යුතු ඉහළ අගයන්ට සාපේක්‍ෂව 2004 වසරේ පළමු භාගයේ අනුරූප මාස සඳහා අවධමනයන් (සෘණ අගයන්) වාර්තා කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, පසුගිය වසරේ දෙවන භාගයේ සිට ඉහළ යාම ආරම්භ වූ බොහොමයක් ආහාර අයිතමයන්ගේ නිෂ්පාදක මිල ගණන් 2005 වසරේ පළමු මාස කිහිපය සඳහාද පැවතීමයි. එසේම, ආයෝජන භාණ්ඩ උපදර්ශකයද සියයට 36 ක පමණ සැළකිය යුතු ඉහළ උද්ධමන අනුපාතයක් පෙන්වීය. පසුගිය වර්ෂයේ සියයට 1 - 8 දක්වා පරාසයක තිබීමට සාපේක්ෂව සියයට 4 - 58 දක්වා පරාසයකින් ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල සැළකිය යුතු ලෙස ඉහළයාම ප්‍රධාන වශයෙන් මෙම තත්ත්වයට හේතු විය. අන්තර් භාණ්ඩවල 2004 වසරේ පැවති සියයට 18 ක මිල ඉහළ යාමට අනුගාමීව 2005 වසරේදී සියයට 11 කින් පමණ ඉහළ ගියේය.

### දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

- **ආර්ථිකයේ නිෂ්පාදිත සියලුම භාණ්ඩවල මිල වෙනස්වීම් මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය, 2004 වසරේ සියයට 9.3 ක ඉහළ යාමට සාපේක්ෂව මෙම වසරේදී සියයට 9.9 ක ඉහළ යාමක් පෙන්වීය.** සේවා අංශය, පසුගිය වර්ෂයේ වාර්තා කළ සියයට 8.8 ට සාපේක්ෂව සියයට 10 ක සැලකිය යුතු වැඩිවීමක් පෙන්වීය. ඉහළ උපයෝගීතාවය සහ ප්‍රවාහන වියදම් සහ අනෙකුත් යෙදවුම් පිරිවැය වැඩිවීම හේතුවෙන් සේවා අංශය යටතේ වන උපදර්ශකයන් හතරම වර්ෂය තුළදී සියයට 5.3 සිට 23.4 අතර පරාසයකින් ඉහළ යාමක් පෙන්වීය. කාර්මික අංශය, පසුගිය වසරේ වාර්තා කළ සියයට 11 ක ඉහළ යාමට වඩා අඩු අනුපාතයකින් එනම් සියයට 9 කින් ඉහළ ගියේය. කාර්මික අංශය යටතේ වන උපදර්ශක තුනෙහිම 2005 වසර තුළදී මධ්‍යස්ථ ඉහළ යාමක් කරන ලදී. ගොඩනැගිලි ඉදිකිරීම් උපදර්ශකය සියයට 14.1 කින් පමණ සැළකිය යුතු ලෙස ඉහළ යාම කාර්මික උපදර්ශකයේ සමස්ත ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය වල ඉහළ යන ආනයන මිල ගණන් සහ තොග මිල දර්ශකයේ ලෝහ නොවන නිෂ්පාදක උප දර්ශකයේ වාර්තා ගත ඉහළ අගයන් මගින්ද මේ තත්ත්වය පෙන්නුම් කෙරිණි. කෘෂිකාර්මික අංශය පසුගිය වසරට සාපේක්ෂව සියයට 10.9 ක ඉහළ යාමක් පෙන්වීය. පොල්, රබර්, වන වගාව සහ මත්ස්‍ය කර්මාන්ත උපදර්ශක පිළිවෙලින් සියයට 25.8, සියයට 14.5, සියයට 18.1 සහ සියයට 10.4 ක ඉහළ යාමක් පෙන්නුම් කළද, වී උපදර්ශකය පසුගිය වර්ෂයේ වාර්තා කළ සියයට 29.7 ක ඉහළ යාමට පටහැනිව සියයට 5 ක පහත වැටීමක් පෙන්වා ඇත. දේශීය කෘෂිකර්මාන්තයේ ඇති අනෙකුත් සියලුම බෝග වර්ග සහ සත්ත්ව පාලනය ආවරණ වන අනෙකුත් කෘෂි ද්‍රව්‍ය උපදර්ශකය, පසුගිය වසරට වඩා සියයට 11.7 ක ඉහළ යාමක් වාර්තා කළේය. යහපත් කාලගුණ තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික නිෂ්පාදන හා සම්බන්ධ බොහොමයක් අංශවල වර්ධනයක් පැවතුණද, කාර්මික අංශයේ වැඩි ඉල්ලුම් තත්ත්වය සහ ඉහළ යෙදවුම් පිරිවැය මෙම කෘෂිකාර්මික අංශයේ උපදර්ශකයන්ගේ ඉහළ යාමට දායක විය. සුනාමි තත්ත්වයට පසු මත්ස්‍ය නිෂ්පාදනය, ඊට පෙර පැවති නිෂ්පාදනයට සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම සහ සුනාමියෙන් පසු නැවත මාළු සඳහා වූ ඉල්ලුම යථා තත්ත්වයට පත් වීම මත්ස්‍ය කර්මාන්ත උප දර්ශකය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය.

**4.2 සංඛ්‍යා සටහන**

**දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

| අංශය | දර්ශකය | | | | ප්‍රතිශත වෙනස | | |
|---|---|---|---|---|---|---|---|
| | 2002 | 2003 | 2004 | 2005 | 2003/02 | 2004/03 | 2005/04 |
| කෘෂිකාර්මික | 165.8 | 168.5 | 182.3 | 202.2 | 1.6 | 8.2 | 10.9 |
| කාර්මික | 157.9 | 167.5 | 185.9 | 202.6 | 6.1 | 11.0 | 9.0 |
| සේවා | 158.9 | 168.1 | 183.0 | 201.3 | 5.8 | 8.8 | 10.0 |
| ද.දේ.නි. | 160.0 | 168.0 | 183.6 | 201.8 | 5.0 | 9.3 | 9.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### මිල විචලනයන්

- **පසුගිය වසර සමඟ සැසඳීමේදී මෙම වසර තුළදී දේශීයව නිෂ්පාදිත බොහෝ භාණ්ඩ හා සේවාවල මෙන්ම ආනයනික භාණ්ඩයන්ගේ ද මිල ගණන් ඉහළ ගිය අතර, සහල්, තිරිඟු ඇට වැනි ප්‍රධාන අයිතම කිහිපයක මිල ගණන් පහත වැටුණි.** ප්‍රධාන පාරිභෝගික අයිතමයක් වන සහල් වල 2004 වසර තුළදී පෙන්නුම් කළ සියයට 16 ත් 28 ත් අතර පරාසයක මිල වැඩිවීමට වෙනස්ව හැසිරෙමින් 2005 වසර තුළදී සියයට 5 ත් 10 ත් අතර පරාසයකින් මිල ගණන් පහත වැටීමක් පෙන්නුම් කෙරිණ. සහල් මිල ගණන් පහළ යාමට දායක වූ ප්‍රධානතම සාධකය වූයේ, වසර තුළ පැවති යහපත් කාලගුණික තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් වැඩි බිම් ප්‍රමාණයක වී වගා කිරීම හේතුකොට ගෙන මහ සහ යල කන්න දෙකේදී ම වී නිෂ්පාදනය පිළිවෙලින් සියයට 21 සහ සියයට 29 ප්‍රතිශතයන්ගෙන් වර්ධනය වීමයි. වසරේ පළමු භාගය තුළදී ආනයනික සහල්වල ඇමෙරිකානු ඩොලර් මිල සියයට 9 කින් අඩුවීමක් පෙන්නුම් කළද, වසරේ දෙවන භාගයේදී සියයට 38 ක ප්‍රතිශතයකින් තියුණු ලෙස ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසරට සාපේක්ෂව මෙම වසර තුළදී ආනයනික සහල් මිල සියයට 13 කින් පමණ ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම වසර තුළදී ආනයනික සහල් ප්‍රමාණය අඩු මට්ටමක පැවති අතර පසුගිය වසරට සාපේක්ෂව සියයට 77 ක පමණ ප්‍රමාණයකින් පහත වැටීමත් සමඟ 2004 වසරේදී මුළු

**4.3 සංඛ්‍යා සටහන**

**ආනයනික සහ දේශීය නිෂ්පාදිත ප්‍රධාන අයිතමයන්ගේ සිල්ලර මිල ගණන්[(අ)]**

| අයිතමය | ඒකකය | ශ්‍රී ලංකා පා.මි.ද. බරිත | මිල රු. වාර්ෂික සාමාන්‍යය 2003 | මිල රු. වාර්ෂික සාමාන්‍යය 2004 | මිල රු. වසර අග 2003 | මිල රු. වසර අග 2004 | මිල රු. වසර අග 2005 | ප්‍රතිශත වෙනස වාර්ෂික සාමාන්‍යය 2004/03 | ප්‍රතිශත වෙනස වාර්ෂික සාමාන්‍යය 2005/04 | ප්‍රතිශත වෙනස වසර අග 2004/03 | ප්‍රතිශත වෙනස වසර අග 2005/04 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දේශීය** | | | | | | | | | | | |
| රතු කැකුළු සහල් | කි.ග්‍රෑ. 1ක් | 16.3 | 28.02 | 35.19 | 29.78 | 41.72 | 32.10 | 25.6 | -6.7 | 40.1 | -23.1 |
| තම්බාපු සහල් | ,, | | 27.71 | 34.09 | 30.03 | 39.66 | 33.65 | 23.0 | -7.0 | 32.1 | -15.2 |
| කෝරා සහල් | ,, | | 27.55 | 33.31 | 29.63 | 37.84 | 32.46 | 20.9 | -4.8 | 27.7 | -14.2 |
| පොල් (මධ්‍යම ප්‍රමාණය) | එකක් | 5.4 | 12.87 | 12.68 | 11.61 | 18.39 | 16.39 | -1.5 | 31.2 | 58.4 | -10.9 |
| මාළු (කෙළවල්ලා) | කි.ග්‍රෑ. 1ක් | 1.4 | 222.74 | 238.07 | 225.31 | 242.68 | 275.60 | 6.9 | 10.8 | 7.7 | 13.6 |
| බෝංචි | ,, | 1.3 | 56.59 | 57.00 | 61.05 | 56.07 | 73.64 | 0.7 | 21.8 | -8.2 | 31.3 |
| වම්බටු | ,, | 0.9 | 34.60 | 36.27 | 40.07 | 54.27 | 45.76 | 4.8 | 15.8 | 35.4 | -15.7 |
| බිත්තර | එකක් | 0.6 | 5.23 | 5.51 | 5.36 | 7.03 | 6.71 | 5.4 | 31.8 | 31.2 | -4.6 |
| **ආනයනික** | | | | | | | | | | | |
| සීනි | කි.ග්‍රෑ. 1ක් | 3.4 | 34.27 | 37.51 | 34.15 | 38.76 | 43.66 | 9.5 | 11.8 | 13.5 | 12.6 |
| කිරිපිටි | ග්‍රෑ. 400 ක් | 3.3 | 128.47 | 136.98 | 129.98 | 149.52 | 158.98 | 6.6 | 14.1 | 15.0 | 6.3 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ. 1ක් | 1.9 | 58.57 | 69.25 | 61.18 | 75.26 | 75.87 | 18.2 | 10.5 | 23.0 | 0.8 |
| තිරිඟු පිටි | ,, | 0.9 | 25.21 | 25.87 | 25.45 | 27.22 | 29.13 | 2.6 | 12.0 | 7.0 | 7.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2004 ජූනි මාසය දක්වා මිල ගණන් මධ්‍යස්ථාන 93ක මාසික මිල ගණන් මත පදනම් වී ඇත. 2004 ජූලි මාසයේ සිට මිල ගණන් උතුරු හා නැගෙනහිර පළාත් වල නව මධ්‍යස්ථාන 14ක මිල ගණන් ද ඇතුළත් කර යාවත්කාලීන කර ඇත.

සහල් සැපයුමෙන් සියයට 12 ක් පමණ වූ ආනයනික සහල් ප්‍රමාණය 2005 වසරේදී සියයට 3 ක් ලෙස සටහන් විය. ඒ අනුව සහල් සිල්ලර මිල ගණන් අඩුවීමට බලපෑ ප්‍රධාන සාධකය වූයේ දේශීය වී නිෂ්පාදනය ඉහළ මට්ටමක පැවතීමයි.

- **සියලු පාරිභෝගික මිල දර්ශකයන්ගේ භාණ්ඩ පැස තුළ සියයට 3 සිට 6 පමණ පරාසයක නියෝජනයක් ඇති ප්‍රධාන පාරිභෝගික අයිතමයක් වූ සීනි වල දේශීය සිල්ලර මිල, 2004 වසරේදී සියයට 9 කින් පමණ ඉහළ යෑම හා සැසඳීමේදී 2005 වසරේදී සියයට 12 කින් පමණ ඉහළ ගියේය.** සහල් මිල ගණන් වලට බලපෑම් ඇතිකළ තත්ත්වයට වඩා වෙනස්ව, ජෛව ඉන්ධන නිපදවීමට අන්තර්ජාතිකව සීනි භාවිතයත් සමග අන්තර්ජාතික වෙළඳ පොලෙහි සීනි මිල ගණන් ඉහළ යාම, සීනිවල දේශීය සිල්ලර මිල වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. රටෙහි මුළු සීනි පාරිභෝජනයෙන් සියයට 89 ක් පමණ සපයන ආනයනික සීනි කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය එ. ජ. ඩොලර් මිල 2004 වසරට සාපේක්ෂව 2005 වසරේදී සියයට 26 කින් පමණ ඉහළ ගියේය. තවද, කම්කරු ආරවුල් සහ උක්දඩු නිෂ්පාදනය සියයට 2 කින් පමණ අඩුවීම හේතුකොට ගෙන දේශීය සීනි නිෂ්පාදනයද සියයට 7 කින් පමණ පහත වැටුණි. එබැවින්, මුළු සීනි සැපයුමෙන් දේශීයව නිෂ්පාදිත ප්‍රමාණය, 2004 වසරේදී සියයට 15 සිට 2005 වසරේදී සියයට 11 ක් දක්වා අඩුවීමක් පෙන්නුම් කෙරිණ.

- **නිෂ්පාදනය අඩුවීම හේතු කොටගෙන පොල්වල සිල්ලර මිල වැඩි වූ අතර, වැඩි නිෂ්පාදනයක් පැවතියද, ධාන්‍ය මිල ඉහළ යාමක් දක්නට ලැබිණ.** පාරිභෝගික පැස තුළ සැලකිය යුතු නියෝජනයක් ඇති පොල් මිල ගණන් 2004 වසරේදී සියයට 1.5 කින් අඩු වුවද, 2005 වසරේදී පසුගිය වසරේ මිල මට්ටම් වලට සාපේක්ෂව සියයට 31 කින් පමණ ඉහළ ගියේය. 2004 අග භාගයේ පැවති නියඟයේ පසු බලපෑම් හේතු කොටගෙන 2005 වසරේ පළමු භාගයේදී පසුගිය වසරේ එම කාල පරිච්ඡේදයට සාපේක්ෂව පොල් නිෂ්පාදනය සියයට 11 කින් පමණ අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස වසරේ පළමු භාගයේදී පොල් වල සිල්ලර මිල ඉතා ඉහළ ප්‍රතිශතයකින්, එනම් සියයට 61 කින් පමණ වැඩි විය. එසේ වුවද, වසරේ දෙවන භාගය වන විට පොල් නිෂ්පාදනයේ ක්‍රමානුකූල වැඩිවීමත් සමඟ පොල් මිල පහත වැටීම ආරම්භ වූ අතර, වසරේ පළමු භාගයට සාපේක්ෂව දෙවන භාගයේදී සියයට 21 කින් පමණ මිල පහත වැටීම තුළින් වසර මුලදී පැවති තත්ත්වය සමනය වීමක් පෙන්නුම් කෙරිණ. තවත් වැදගත් පාරිභෝගික අයිතමයක් වන රතු පරිප්පු ආනයන මිල 2005 වසරේදී සියයට 10 කින් පමණ ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සිල්ලර මිල පසුගිය වසරට වඩා සියයට 11 කින් පමණ ඉහළ ගියේය. 2005 වර්ෂයේදී දේශීය ධාන්‍ය නිෂ්පාදනය වර්ධනයක් පෙන්නුම් කළද, ධාන්‍ය වර්ගවල සියයට 3 සිට 31 අතර පරාසයක මිල ඉහළ යාමක් වාර්තා විය.

- **නිෂ්පාදනය පුළුල් වීමක් සිදු වුවද, එළවළු, අල වර්ග සහ පළතුරු සිල්ලර මිල වැඩි වීමක් පෙන්විය.** 2004 වසරේදී එළවළු මිල ගණන්වල මිශ්‍ර වෙනස්කම් පැවති නමුදු බොහොමයක් එළවළු වර්ගවල දේශීය නිෂ්පාදනය ඉහළ මට්ටමක තිබියදීත්, මිල ගණන් පසුගිය වසරට සාපේක්ෂව ඉහළ යාමක් පෙන්නුම් කෙරිණ. එසේ වුවද, වසරේ පළමු කාර්තු තුන තුළදී මිල ගණන්වල මිශ්‍ර වෙනස්වීම් දක්නට ලැබුණු අතර, කාර්තුමය

වෙනස්වීම් සියයට -22 සහ 17 අතර විචලනය විය. ඒ අතර, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී පැවති අධික වැසි සහිත තත්ත්වය හේතුකොට ගෙන එළවළු නිෂ්පාදනයේ ඍතුමය පහත බැස්ම තව දුරටත් උග්‍ර කිරීම නිසා හතරවන කාර්තුවේදී තුන්වන කාර්තුවේදී මිල ගණන් හා සැසඳීමේදී සියලුම එළවළු වර්ගවල මිල සියයට 1 සිට 13 අතර පරාසයක ඉහළ යාමක් සිදුවිය. දේශීය නිෂ්පාදිත සහ ආනයනික අර්තාපල් මිල පසුගිය වසරට සාපේක්ෂව සියයට 9 කින් පමණ ඉහළ ගියේය. එසේම, රතු ළූණු සහ දේශීය ලොකු ළූණු පසුගිය වසරේ වාර්තා වූ සියයට 5 සහ සියයට 13 පමණ මිල වැඩිවීම් සමඟ සැසඳීමේදී 2005 වසරේදී පිළිවෙලින් සියයට 13 කින් සහ සියයට 11 කින් පමණ මිල ඉහළ යාමක් පෙන්නුම් කෙරිණ. 2005 වසරේදී දේශීය ළූණු නිෂ්පාදනය ඉහළ මට්ටමක පැවතියද, වසර අගදී පැවති වැසි සහිත කාලගුණය හේතුකොට ගෙන නිෂ්පාදන නරක් වීම වෙළඳපොළ ළූණු සැපයුම පහත වැටීමට දායක වූ අතර, ඒ හේතුවෙන් හතරවන කාර්තුවේදී සැලකිය යුතු ලෙස මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස සමස්ත වර්ෂය සඳහා මිල වැඩිවීමක් වාර්තා විය. ලොකු ළූණු ආනයන මිල සියයට 9 කින් පමණ අඩු වුවද, සාපේක්ෂ වශයෙන් වසර තුළදී ආනයනික ලොකු ළූණු ප්‍රමාණය පහළ මට්ටමක පැවතීම හේතුකොට ගෙන දේශීය සිල්ලර මිල ඉහළ අගයක රැඳී පැවතිණ. බොහෝ ප්‍රධාන පලතුරු වර්ගවල දේශීය නිෂ්පාදනය වැඩි වුවද, 2004 වසරේ වාර්තා කල සියයට -11 සිට සියයට 9 අතර පරාසයක වූ මිශ්‍ර මිල වෙනස්වීම් හා සැසඳීමේදී 2005 වසරේදී සියලුම දේශීය නිෂ්පාදිත පලතුරු සියයට 2 සිට 38 අතර පරාසයක මිල ඉහළ යාමක් වාර්තා කළේය.

- **මාළු, මස් සහ කිරි නිෂ්පාදන මිල ගණන් සියයට 8 සිට 33 අතර පරාසයක් තුළ වෙනස් අනුපාත වලින් වැඩිවීමක් වසර තුළදී පෙන්නුම් කෙරිණ**. පෙර වසර කීපය තුළදී අඛණ්ඩව පැවති ඉහළ මිල ගණන් නිරූපනය කරමින් 2005 වසර පුරාම මෙම ප්‍රෝටීන් ප්‍රභවයන් ගේ මිල පසුගිය වසරට සාපේක්ෂව ඉහළ විය. 2004 වසර අගදී මුහුණ දුන් සුනාමි ව්‍යසනය හේතු කොටගෙන පළමු කාර්තුව තුළදී මුහුදු මාළු නිෂ්පාදනය සියයට 77.5 කින් පමණ විශාල අඩුවීමක් වාර්තා වුවද, මාළු සඳහා වූ ඉල්ලුම පහත වැටීම හේතු කොටගෙන වසරේ පළමු මාස දෙක තුළදී මාළු මිල අඩු වුවත්, පළමු කාර්තුව අවසාන විට මිල ගණන් පෙර සුනාමි මට්ටම් වලට නැවත පත්විය. පසුගිය වසරේ අනුරූප කාර්තුවලට සාපේක්ෂව මුහුදු මාළු මිල, මෙම වසරේ පළමු කාර්තුවේදී සියයට -1.5 සිට හතරවන කාර්තුවේදී සියයට 11 අතර පරාසයක විචලනය විය. සුනාමි බලපෑම් හේතුකොට ගෙන වසර පුරාම මුහුදු මාළු නිෂ්පාදනය අඩු මට්ටමක පැවති නමුදු, 2005 වර්ෂයේදී සාමාන්‍ය මිල ඉහළ යාම තරමක අඩු මට්ටමක එනම් සියයට 8 සිට 13 අතර පරාසයක රඳා පැවතිණි. රටෙහි අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව උතුරු පළාතේ මාළු මිල ගණන් අඩු අගයන් වාර්තා කිරීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. මිරිදිය මත්ස්‍ය මිල ගණන් මීට ප්‍රතිවිරුද්ධව යමින් කාර්තුමය විචලනයන් පෙන්නුම් කළ අතර පසුගිය වසරේ අනුරූප කාර්තුවලට සාපේක්ෂව පළමු කාර්තුවේදී සියයට 45 ක වැඩිවීමක් සහ හතරවන කාර්තුවේදී සියයට 28 ක වැඩිවීමක් සටහන් කිරීම තුළින් මාළු වර්ග දෙක අතර ආදේශක බලපෑම පෙන්නුම් කෙරිණ. පසුගිය වසරේ සියයට 5 ක මිල ඉහළ යාම සමඟ සැසඳීමේදී 2005 වසරේදී බිත්තර මිල සියයට 32 කින් පමණ ඉහළ ගියේය. සුනාමි හේතුකොට ගෙන මුහුදු මාළු

**4.4 සංඛ්‍යා සටහන**

**පරිපාලිත මිල වෙනස්වීම්**

| අයිතමය | ඒකකය | මිල (රු.) | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | | 2003 | 2004 | 2005 | 2004/2003 | 2005/2004 |
| සිගරට් (ගෝල්ඩ්ලීෆ්) | එකක් | 8.50 | 9.00 | 10.50 | 5.9 | 16.7 |
| සිගරට් (බ්‍රිස්ටල්) | එකක් | 7.00 | 7.50 | 9.00 | 7.1 | 20.0 |
| පොල් අරක්කු | මි.ලී. 750 | 300.00 | 338.50 | 365.00 | 12.8 | 7.8 |
| අති විශේෂ අරක්කු | ” | 260.00 | 290.00 | 335.00 | 11.5 | 15.5 |
| ඩීසල් | ලී. 1ක් | 32.00 | 44.00 | 50.00 | 37.5 | 13.6 |
| භූමිතෙල් | ” | 25.50 | 25.50 | 30.00 | 0.0 | 17.6 |
| පෙට්‍රල් | ” | 53.00 | 70.00 | 80.00 | 32.1 | 14.3 |
| දුම්තෙල් (1000) | ” | 23.20 | 24.70 | 24.70 | 6.5 | 0.0 |
| දුම්තෙල් (1500) | ” | 22.30 | 24.30 | 30.30 | 9.0 | 24.7 |
| දුම්තෙල් (3500) | ” | 20.70 | 22.00 | 28.00 | 6.3 | 27.3 |
| ජලය | ඒකක පරාසය 16-20 | 6.50 | 6.50 | 8.50 | 0.0 | 30.8 |
| | ” 21-25 | 20.00 | 20.00 | 30.00 | 0.0 | 50.0 |
| | ” 26-30 | 45.00 | 45.00 | 50.00 | 0.0 | 11.1 |
| | ” 31-40 | 45.00 | 45.00 | 60.00 | 0.0 | 33.3 |
| | ” 41-50 | 45.00 | 45.00 | 70.00 | 0.0 | 55.6 |
| | ” > 50 | 45.00 | 45.00 | 75.00 | 0.0 | 66.7 |
| බස් ගාස්තු | - | - | - | - | 6.0 | 15.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පාරිභෝජනයෙන් බිත්තර පාරිභෝජනයට යොමුවීම පෙන්නුම් කරමින් ඉහළම බිත්තර මිල වසරේ පළමු කාර්තුවේදී වාර්තා කළ අතර 2004 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව මිල ඉහළ යාම සියයට 53 ක් පමණ විය. සියලුම මස් වර්ග මිල ගණන් සියයට 15 ට වැඩි ප්‍රතිශත වලින් ඉහළ ගිය අතර ජාත්‍යන්තර වෙළඳපොළෙහි කිරිපිටි මිල ගණන් ඇමෙරිකානු ඩොලර් වලින් සැලකීමේදී සියයට 13 කින් පමණ ඉහළ ගියේය. කිරි මූලික කොටගත් අනෙකුත් ආනයනික කිරි නිෂ්පාදන මිල ගණන් ද වසර තුළදී ඉහළ ගියේය. ජීවන තත්ත්වය උසස් වීමත් සමඟ ප්‍රෝටීන් සහ අනෙකුත් පෝෂ්‍යදායී කැලරි වැඩි ආහාර වර්ග සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම සහ යෙදවුම් පිරිවැය මෙන්ම ඉහළ යන ප්‍රවාහන වියදම්, වර්ෂය තුළදී වාර්තා කළ ඉහළ මිල ගණන් වලට හේතු වන්නට ඇත.

- **වියළි මිරිස්, ලොකු ළූණු, තිරිඟු ඇට සහ තිරිඟු පිටි වැනි ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ කිහිපයක ආනයනික මිල අඩු වූ අතර, පාරිභෝගික භාණ්ඩ කෙරෙහි සෘජුවම මෙන් ම වක්‍රාකාරයෙන් ද බලපෑම් ඇති කරන අන්තර් සහ ආයෝජන භාණ්ඩ වල ආනයන මිල ඉහළ යාමක් වාර්තා කළේය.** මෙම අන්තර් ආනයන භාණ්ඩ අතුරින් ඉතාම වැදගත් ස්ථානයක් උසුලන බොරතෙල් බැරලයක ආනයන මිල 2004 වර්ෂයේදී වාර්තා කළ ඇමෙරිකානු ඩොලර් 38 ට සාපේක්ෂව 2005 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් 53 ක් වාර්තා කළ අතර, ප්‍රතිශතයක් ලෙස සියයට 41 ක පමණ මිල ඉහළ යාමකි. 2004 සහ 2003 වර්ෂ වලදී මිල ඉහළ යාම පිළිවෙලින් සියයට 28 ක් සහ සියයට 17 ක් පමණ විය. අප්‍රේල් මාසයේ දී මිල සියයට 50 කින් පමණ ඉහළ ගිය අතර වසරේ වාර්තා වූ උච්චතම මිල වැඩිවීම විය. ඒ අනුව, වෙනස්වන අන්තර්ජාතික තෙල් මිල ගණන්වලට ප්‍රතිචාර දක්වීම පිණිස ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් සහ දුව් තෙල් ආදි පෙට්‍රෝලියම් නිෂ්පාදනවල දේශීය මිල ගණන් වසර තුළදී අවස්ථා දෙකක දී ඉහළට සංශෝධනය කරන ලදි. සියලුම පාරිභෝගික මිල දර්ශකවල ඉන්ධන සහ විදුලිය උපදර්ශක සහ ප්‍රවාහන පිරිවැය ඉහළ යාම තුළින් භූමිතෙල්, පෙට්‍රල් සහ ඩීසල් මිල ඉහළයාම පෙන්නුම් කෙරිණ. එල්. පී. ගෑස්වල ඇමෙරිකානු ඩොලර් මිල සියයට 27 කින් ඉහළ යාමට ප්‍රතිචාර දක්වමින් එල්. පී. ගෑස් කිලෝග්‍රෑම් එකක දේශීය සාමාන්‍ය මිල සියයට 26 කින් වැඩි විය. මෙම තත්ත්වය පිළියෙල කරන ලද ආහාර වර්ගවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාමට බලපෑම් ඇති කරන ලදි. සාමාන්‍ය වශයෙන් පොහොර මෙට්‍රික් ටොන් එකක ආනයන මිල ඇමෙරිකානු ඩොලර් වලින් සැලකීමේදී සියයට 21 කින් පමණ වසර තුළදී ඉහළ ගියේය. ආයෝජන භාණ්ඩ ආනයන මිලද ඉහළ ගිය අතර, විශේෂයෙන්ම ගොඩනැගිලි ද්‍රව්‍ය මිල 2004 වර්ෂයේ වූ සියයට 1 සිට 8 අතර පරාසයක් තුළ ඉහළ යාමට සාපේක්ෂව 2005 වර්ෂය තුළදී සියයට 4 සිට 20 අතර පරාසයකින් ඉහළ යාමක් පෙන්නුම් කෙරුණි. අන්තර් සහ ආයෝජන භාණ්ඩ ආනයන මිල මෙලෙස ඉහළ යාම, වර්ෂය තුළ සමස්ත මිල වර්ධනයන් කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කරන ලදී.

**ප්‍රාදේශීය මිල වෙනස්වීම්**

- **ප්‍රාදේශීය වශයෙන් භාණ්ඩවලට ඇති ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වය සහ ඒවායේ ගුණාත්මක තත්ත්වයට අදාළ සාධක හේතු කොටගෙන භාණ්ඩ මිල ගණන්වල ප්‍රාදේශීය වෙනස්කම් ඇති විය හැකිය.** නිෂ්පාදන සිදු කරන ප්‍රදේශය, ඵලදායීතාවයේ වැඩි දියුණුව, නිෂ්පාදන බෙදාහැරීමේදී පවතින වර්ධිත කාර්යක්ෂමතාව සහ වෙළඳපොළ තත්ත්වය පිළිබඳ කාලීන තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව මත සැපයුම් අංශයේ සාධක රඳා පවතී. තෝරාගත් භාණ්ඩ කීපයක 2004 සහ 2005 වර්ෂ වලදී සිල්ලර මිල ගණන්වල ප්‍රාදේශීය වෙනස්කම් සන්සන්දනය කිරීම සඳහා සංඛ්‍යාන විද්‍යාත්මක මිණුම් දණ්ඩක් වන විචලන සංගුණකය භාවිතා කරන ලදී[3]. මෙය මගින් එක් එක් භාණ්ඩයේ පළාත් අතර සාමාන්‍ය මිල ගණන් රටෙහි සමස්ත සාමාන්‍ය මිලට සාපේක්ෂව වෙනස් වීම මනිනු ලැබේ.

- **කල් තබාගත නොහැකි (ඉක්මනින් නරක් වන) අයිතමයන්ගේ මිල විචලනයන් සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි.** බොහොමයක් එළවළු වර්ග සඳහා විචලන සංගුණක වැඩි අගයන් ගත් අතර උඩරට එළවළු

3. විචලන සංගුණකය (වි.ස.) යනු සංඛ්‍යාන විද්‍යාත්මක මිනුම් දණ්ඩක් වන අතර එමගින් කිසියම් දෙන ලද විචල්‍යයක අගයන් එහි සාමාන්‍ය අගයේ සිට වෙනස්වීමේ සාමාන්‍ය මනිනු ලබයි. (සම්මත අපගමනය x 100 / මධ්‍යයනය) ඒ අනුව අඩු විචලන සංගුණකයකින් අඩු විචලතාවක් ද වැඩි විචලන සංගුණකයකින් වැඩි විචලතාවක් ද පෙන්නුම් කෙරේ.

**4.5 සංඛ්‍යා සටහන**

**තෝරාගත් ප්‍රධාන පාරිභෝගික අයිතමයන්හි මිල ගණන්වල විචලන සංගුණක(අ)**

| අයිතමය | ශ්‍රී ලංකා පා.මි.ද. හරිත | පළමු භාගය 2004 | පළමු භාගය 2005 | දෙවන භාගය 2004 | දෙවන භාගය 2005 |
|---|---|---|---|---|---|
| සහල් | | | | | |
| සම්බා (ඉහළම) | 16.3 | 4.6 | 4.9 | 3.5 | 5.8 |
| නම්බාඩු ( ,, ) | | 3.9 | 5.6 | 4.4 | 5.2 |
| රතු කැකුළු ( ,, ) | | 4.2 | 5.1 | 4.4 | 6.4 |
| කෝරා ( ,, ) | | 6.9 | 5.8 | 5.1 | 4.2 |
| පොල් | 5.4 | 7.7 | 6.1 | 5.5 | 7.8 |
| අර්තාපල් | 0.7 | 2.1 | 2.9 | 4.0 | 4.5 |
| රතුළූණු | 1.1 | 5.2 | 5.4 | 7.0 | 6.4 |
| වියළි මිරිස් | 1.4 | 2.9 | 4.8 | 3.7 | 3.6 |
| එළවළු | | | | | |
| බෝංචි | 1.3 | 6.4 | 6.6 | 11.6 | 6.6 |
| බීට්රූට් | 0.6 | 7.5 | 10.1 | 10.4 | 11.5 |
| වම්බටු | 0.9 | 9.0 | 12.2 | 17.1 | 12.2 |
| බණ්ඩක්කා | 0.6 | 12.2 | 12.4 | 13.1 | 12.7 |
| මාළු | | | | | |
| ගල් මාළු(ආ) | - | 10.6 | 11.4 | 13.3 | 11.2 |
| කුකුල් මස් (බොයිලර්) | 1.0 | 2.7 | 3.5 | 5.5 | 6.2 |
| බිත්තර | 0.6 | 4.9 | 3.9 | 6.3 | 5.5 |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2004 ජූනි මාසය දක්වා මිල ගණන් මධ්‍යස්ථාන 93ක මාසික මිල ගණන් මත පදනම් වී ඇත. 2004 ජූලි මාසයේ සිට උතුරු හා නැගෙනහිර පළාත්වල මධ්‍යස්ථාන 14ක මිල ගණන් ද ඇතුලත් කර යාවත්කාලීන කර ඇත.

(ආ) ගල් මාළු ශ්‍රී ලංකා පා.මි.දර්ශකයෙහි අඩංගු නොවූවද 2003/04 පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව මෙම මාළු වර්ගය පළාත් 9 යෙහිම පරිභෝජනය කරයි.

**4.3 රූප සටහන**

**තෝරා ගත් භාණ්ඩවල පළාත් අනුව සිල්ලර මිල ගණන්(අ)**




(අ) 2004 ජූනි මාසය දක්වා මිල ගණන් මධ්‍යස්ථාන 93 ක මාසික මිල ගණන් මත පදනම් වී ඇත. 2004 ජූලි මාසයේ සිට මිල ගණන් උතුරු හා නැගෙනහිර පළාත් වල නව මධ්‍යස්ථාන 14 ක මිල ගණන් ද ඇතුළත් කර යාවත්කාලීන ඇත.

සමහ සැසඳීමේදී පහතරට එළවළු වල විචලන සංගුණක ඉහළ අගයන් ගන්නා ලදි. සුනාමිය හේතුකොට ගෙන ධීවර අංශයේ යටිතල ව්‍යුහයට තදින්ම අලාභ හානි සිදුවීම තවත් ඉක්මනින් නරක් වීමට භාජනය වන අයිතමයක් වන අලුත් මාළු වර්ග සාපේක්ෂව ඉහළ විචලන සංගුණක පෙන්වීමට හේතුවිය. ශීතකරන සහ ගබඩා පහසුකම් විනාශ වීමේ ප්‍රතිඵලයක් ලෙස සහ විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශවලට ප්‍රවේශ වීමේ දැඩි අපහසුතාව හේතු කොටගෙන සීමිත දේශීය ඉල්ලුමට වඩා වැඩිපුර වූ මාළු සැපයුම බෙදා හැරීමේ අපහසුතාවක් මෙම ප්‍රදේශවල පැවතිය හැකිය. මෙම තත්ත්වය මාළු මිල ගණන් කෙරෙහි පහළට නැඹුරු වූ පීඩනයක් ඇති කිරීමට හේතු විය හැකිය. අනෙකුත් පළාත්වල මිල ගණන් සමහ සැසඳීමේදී උතුරු පළාතේ මාළු මිල ගණන් සැලකිය යුතු ලෙස අඩු මට්ටමක

පැවතිණි. පළාත් අතර මාළු මිල ගණන්වල නිරීක්ෂිත ඉහළ විචලනයන්ට මෙම තත්ත්වය හේතු සාධක විය.

- **වඩා වැඩි කාලයක් තබාගත හැකි ආහාර ද්‍රව්‍යවල පළාත් අතර වූ මිල විචලනයන් සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක රඳා පැවතිණ.** සියලුම සහල් වර්ග සඳහා ඇස්තමේන්තු කරන ලද විචලන සංගුණක සියයට 7 ට වඩා අඩු විය. මිල මට්ටම් ඉහළව පැවතුනද, පසුගිය වසරට සාපේක්ෂව රතු ළූණු සහ බිත්තරවල විචලන සංගුණක අඩු අගයන් ගන්නා ලදි. කෙසේ වුවද, වර්ෂය තුළදී මිල ඉහළ සහ පහළ යාම හේතුකොට ගෙන පොල් මිල ගණන් වැඩි විචලනයක් පෙන්නුම් කළ අතර පසුගිය වසරේ ඇස්තමේන්තු කරන ලද සියයට 5 ක පමණ වූ විචලන සංගුණකයට සාපේක්ෂව 2005 වසරේදී සියයට 8 ක් වාර්තා විය.

- **විචලන සංගුණකයන් මගින් පෙන්නුම් කරන ආකාරයට ඉක්මනින් නරක්වන ද්‍රව්‍යවල දක්නට ලැබෙන වැඩි මිල විචලනයන් තුළින් භාණ්ඩ ගබඩා කිරීමේ කාර්යක්ෂමතාව, ශීතකරණ පහසුකම්, ප්‍රවාහනය සහ පරිහරණය පදනම් කොටගත් ක්‍රියාවලින්ගේ ගුණාත්මක වෙනස්වීම් පිළිඹිබු කෙරේ.** මේ ආකාරයෙන් පළාත් අතර පාරිභෝගික භාණ්ඩයන්ගේ ඉහළ මිල වෙනස්වීම් පැවතීමට වෙළඳපොල කාර්යක්ෂමතාවයේ පවතින මෙවැනි ආකාරයේ වෙනස්කම් දායක විය හැකිය.

## 4.3 වැටුප්

### රාජ්‍ය අංශය

- **2004 වසර සඳහා වූ දෙවන වැටුප් සංශෝධනය. 2004 දෙසැම්බර් මස පළමුවෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය අංශයේ සේවකයින් 2004 වසරේදී මෙන්ම 2005 වසරේදී ද සැලකිය යුතු වැටුප් වැඩිවීමක ප්‍රතිලාභ ලැබීමට සමත් විය[4].** රාජ්‍ය අංශයේ වැටුප් හා වේතන රජය මගින් නියම කරනු ලබන අතර, වරින් වර මෙම වැටුප් සඳහා සංශෝධනයන් සිදුකෙරේ. 2004 දෙසැම්බර් සංශෝධනයට අනුව, පවතින මූලික වැටුපෙන් සියයට 40 ක් වන පරිදි මසකට අවමය රු. 3,250/- ක් හෝ උපරිමය රු. 9,000/- කට යටත්ව හා අනෙකුත් දීමනා සහිතව වැටුප් වැඩි කරනු ලැබීය. මෙම නව වැටුප් පරිමාණයන් අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. යෝජිත වැඩි කිරීම් වලින් සියයට 50 ක් හෝ රු. 2,500/- යන දෙකෙන් වැඩි අගය 2004 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක වූ අතර ඉතිරි කොටස පරිපාලනය පිළිබඳ ජාතික කවුන්සලයේ නිර්දේශ වලට යටත්ව 2006 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි වේ. පළමු වැටුප් සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස, 2005 වසරේ දී විධායක නොවන නිලධාරීන්ගේ, සුළු සේවකයින්ගේ සහ රජයේ පාසල් ගුරුවරුන්ගේ නාමික වැටුප් පරිමාණ දර්ශකයන් 2004 වසරට සාපේක්ෂව ඉහළයාම පිළිවෙලින් සියයට 28, 31 හා 27 ක් විය. ඒ අනුව රජයේ සේවකයින් සඳහා වූ සමස්ත නාමික වැටුප් පරිමාණ දර්ශකය සියයට 29 කින් ඉහළ යන ලදි.

- **රාජ්‍ය සේවකයින්ගේ නාමික වැටුප් ඉහළයාම පාරිභෝගික මිල දර්ශකයේ උද්ධමනයට ගැලපූ පසු, ඔවුන්ගේ මූර්ත වැටුප් ඉහළයාම සියයට 14 සිට 18 අතර පරාසයක සිදුවිය.** සමස්තයක් ලෙස මූර්ත වැටුප් ඉහළයාම සැලකූවිට, මෙම කාණ්ඩ තුන අතුරින් සුළු සේවකයින් වඩාත් ඉහළ වැඩි වීමේ ප්‍රතිශතයක් ලබා ඇත. මෙම වැටුප් වැඩිවීම් කලින් වසර තුළ සිදු වූ වැටුප් වැඩි වීමට බොහෝ දුරට සමාන බවක් දක්විය. ඒ අනුව, ඉහළ උද්ධමනය නොසළකා, පොදුවේ ගත් කල රාජ්‍ය සේවකයින් සැලකිය යුතු මූර්ත වැටුප් වැඩිවීමක් 2004 හා 2005 වසර දෙකෙහිදී ම භුක්ති විඳින ලදි.

4. රාජ්‍ය අංශයේ සේවකයින් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් රාජ්‍ය (මධ්‍යම රජයේ, පළාත් සභා හා පළාත් පාලන ආයතන) හා අර්ධ රාජ්‍ය (රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අධිකාරීන්) වේ.

**4.6 සංඛ්‍යා සටහන**

**වැටුප් පරිමාණ දර්ශක අංක**

**(1978 දෙසැම්බර් = 100)**

| සේවක කාණ්ඩ | නාමික | | | මූර්ත | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | නාමික | | මූර්ත | |
| | 2003 | 2004 | 2005(අ) | 2003 | 2004 | 2005(අ) | 2004 | 2005(අ) | 2004 | 2005(අ) |
| **1. රජයේ සේවකයන්** | | | | | | | | | | |
| මධ්‍යම රජයේ සේවකයන් | 1,525.0 | 1,872.1 | 2,417.5 | 108.1 | 123.3 | 142.7 | 22.8 | 29.1 | 14.0 | 15.8 |
| විධායක නොවන | 1,410.3 | 1,709.0 | 2,178.4 | 100.0 | 112.5 | 128.6 | 21.2 | 27.5 | 12.6 | 14.3 |
| සුළු සේවකයන් | 1,636.7 | 2,039.5 | 2,672.4 | 116.0 | 134.3 | 157.8 | 24.6 | 31.0 | 15.7 | 17.5 |
| රජයේ පාසැල් ගුරුවරුන් | 1,180.1 | 1,428.4 | 1,818.6 | 83.7 | 94.1 | 107.4 | 21.0 | 27.3 | 12.4 | 14.1 |
| **2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන්** | | | | | | | | | | |
| සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | 1,205.2 | 1,233.0 | 1,329.7 | 85 4 | 81.3 | 78.5 | 2.3 | 7.8 | -4.8 | -3.5 |
| කෘෂිකර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 1,382.2 | 1,397.7 | 1,527.4 | 98.0 | 92.2 | 90.2 | 1.1 | 9.3 | -5.9 | -2.3 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලුණු කම්කරුවන් | 1,009.4 | 1,044.1 | 1,078.4 | 71.6 | 68.9 | 63.7 | 3.4 | 3.3 | -3.7 | -7.6 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 678.0 | 751.0 | 779.7 | 48.1 | 49.5 | 46.0 | 10.8 | 3.8 | 2.9 | -7.0 |

(අ) තාවකාලික

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**සංවිධිත පෞද්ගලික අංශය**

- **2005 අයවැය යෝජනා වලින් රාජ්‍ය සේවකයන්ට ලබාදුන් වැටුප් වැඩිවීමට සමගාමීව, පෞද්ගලික අංශයේ සේවකයින්ගේ වැටුප් 2005 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි රු. 1000/- කින් ඉහළ නැංවීමට, සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත (2005) පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලදී.** වැඩිවන ජීවන වියදමෙන් පෞද්ගලික අංශයේ සේවකයින් ආරක්ෂා කිරීමට මෙමගින් හැකිවේ. රජය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන වැටුප් වැඩිවීම් මගින් මෙන්ම තනි පුද්ගල සේවක ප්‍රතිඥා, සාමූහික ගිවිසුම්, සේව්‍යයන්ගේ ඒකපාර්ශ්වික තීරණ සහ පඩිපාලක සභාවල අවම වැටුප් තීරණ මගින්ද, සංවිධිත පෞද්ගලික අංශයේ වැටුප් සඳහා බලපෑම් කෙරේ[5]. ඉහත පනත යටතේ නිර්දේශ කරනු ලැබූ වැටුප් වැඩි කිරීම මගින් සංවිධිත පෞද්ගලික අංශයේ අවම වැටුප් දර්ශක මත ඇති කරනු ලැබූ බලපෑම සීමිත විය.

- **වසර 2005 දී කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ සහ සේවා යන සංවිධිත පෞද්ගලික අංශයේ ප්‍රධාන අංශ තුනෙහි නාමික අවම වැටුප් වැඩිවීම පිළිවෙලින් සියයට 9 ක්, සියයට 3 ක් සහ සියයට 4 ක් පමණ විය.** මේ අනුව, පඩිපාලක සභා මගින් ආවරණය වන සේවක මණ්ඩල සඳහා කම්කරු දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන සමස්ත නාමික වැටුප් පරිමාණ දර්ශකය සියයට 8 කට ආසන්න වැඩිවීමක් පෙන්නුම් කළේය. මෙම අංශ තුනෙහිම සේවකයින්ට තම මූර්ත අවම වැටුප් මට්ටම්වල පාඩුවක් විඳීමට සිදුවිය. වසර 2004 දී මූර්ත අවම වැටුප් වැඩිවීමේ ප්‍රතිලාභ ලැබූ එකම අංශය වූ සේවා අංශයේ සේවකයින්ට ද 2005 දී ඉහළ පාඩුවක් විඳීමට සිදුවිය. 2004 වසරට සාපේක්ෂව, කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයන්ට ද විශාල පාඩුවක් විඳීමට සිදුවිය. කෘෂිකාර්මික අංශයේ සේවකයන්ට ද පාඩු විඳීමට සිදුවූ නමුදු, එය 2004 හිදී පාඩුව මෙන්ම 2005 දී වූ සමස්ත පාඩුවට වඩා අඩු අගයක් විය. වසර 2004 හා 2005 දෙකෙහිම ඇතිවූ ඉහළ උද්ධමන තත්ත්වයන්ට අනුව, පොදුවේ ගත් කල මෙම වසර දෙකම තුළදී සිදුවූ අවම වැටුප් අනුපාතයන්ගේ වැඩිවීම, අවම මූර්ත වැටුප් මට්ටමක් පවත්වා ගැනීමට ප්‍රමාණවත් නොවිණි. කෙසේ වුවද, මෙම අංශයන්ගේ වෘත්තිමය හා කළමනාකාරීත්ව කාණ්ඩවල සියලුම ගෙවීම් සහ වැටුප් ඉපැයීම් අවම වැටුප් පරිමාණ දර්ශක මගින් ආවරණය නොකරන බැවින්, සමස්ත සත්‍ය තත්ත්වය අවම වැටුප් පරිමාණ දර්ශක වලින් පිළිඹිමු වන තත්ත්වයට වඩා වෙනස් විය හැකිය.

5. ප්‍රධාන අර්ථසාධක අරමුදලට (EPF) හෝ කම්කරු කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව, පෞද්ගලිකව පවත්වාගෙන යනු ලබන අර්සාධක අරමුදලකට හෝ දායක මුදල් ගෙවනු ලබන පෞද්ගලික අංශයේ ආයතන, සංවිධිත පෞද්ගලික අංශය යටතට ගැනේ.

**අසංවිධිත පෞද්ගලික අංශය**

- **ශ්‍රී ලංකා මහ බැංකුවේ දිවයින ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩසටහන (දිප දත්ත) යටතේ අසංවිධිත පෞද්ගලික අංශයේ කෘෂිකාර්මික හා ඉදිකිරීම් අංශ ආවරණය කරමින් රැස්කරනු ලබන දෛනික වැටුප් අනුපාතයන් සාපේක්ෂ අඩු විචලනයන් පෙන්නුම් කෙරිණි.** අසංවිධිත පෞද්ගලික අංශයේ නාමික වැටුප්, නිදහස් වෙළඳපොළ තත්ත්වයන් යටතේ තීරණය වේ.[6] වැඩිවන ජීවන වියදම, පවතින වෙළඳපොළ තත්ත්වයන්, ශ්‍රම තීව්‍රතා ප්‍රමාණය හා එම කාර්යය සඳහා අවශ්‍ය පුහුණුව සහ විවිධ කාර්යයන් හා ප්‍රදේශ අතර මාරුවීමේ විකල්ප අවස්ථා තිබීම වැනි කරුණු මගින් මෙම වැටුප් මත බලපෑම් ඇති කෙරේ. වසර 2005 තුළදී කෘෂිකාර්මික අංශයේ දෛනික නාමික වැටුප්වල වෙනස්වීම සියයට -1 සිට 6 අතර විය. ගොඩනැගිලි ඉදිකිරීමේ අංශයේ වැටුප්වල වැඩිවීම සියයට 4 සිට 9 දක්වා පරාසයක පැවතුණි.

- **තේ වගා අංශය හැර, කෘෂිකාර්මික අංශයේ සියලුම අංශවල නාමික වැටුප්වල ආන්තික වැඩිවීමක් වාර්තා විය.** තේ වගාවේ තේ දළු නෙලීම සහ වගා නඩත්තු ක්‍රියාවලීන් (වැටි බැඳීම, කාණු කැපීම, කුස්තැ ගැසීම, පොහොර යෙදීම හා ගස් කැපීම) සඳහා වූ වැටුප් ඉහළ ගිය අතර, නැවත වගා කිරීමේ ක්‍රියාවලීන් (බිම් සකස් කිරීම, වලවල් කැපීම, වලවල් වැසීම සහ පැළ සිටුවීම) සඳහා වූ වැටුප් පහළ යාමක් සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස තේ වගා අංශයේ සමස්ත නාමික වැටුප්වල ආන්තික අඩුවීමක් සිදුවිය. තවද, පසුගිය වසරේ සියයට -0.7 සිට 6 දක්වා පරාසයක වෙනස් වූ කෘෂිකාර්මික අංශයේ මූර්ත වැටුප් සියයට 6 සිට 13 දක්වා පරාසයකින් අඩුවීමක් දක්නට ලැබිණි.

- **වසර 2005 දී ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම් පුළුල්වීම හේතුකොට ගෙන, ගොඩනැගිලි ඉදිකිරීම් අංශයේ සේවකයන් සඳහා වූ ඉල්ලුම ඉහළ ගියේය.** මෙම තත්ත්වය සිමෙන්ති සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය පාරිභෝජනය ඉහළ යාමෙන්ද, නිවාස ව්‍යාපෘති සඳහා බැංකු ණය සැපයීම වැඩි වීමෙන්ද මනාව පෙන්නුම් කෙරේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ගොඩනැගිලි ඉදිකිරීම් අංශයේ සේවකයින්ගේ නාමික වැටුප්වල ඉහළයෑමක් වාර්තා විය. වසර තුළදී ප්‍රධාන වඩු කාර්මික හා ප්‍රධාන පෙදරේරුවරුන්ගේ නාමික වැටුප් වැඩිවීම, පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන්ට වඩා ඉහළ මට්ටමකින් වාර්තා විය. කෙසේ වෙතත්, ගොඩනැගිලි ඉදිකිරීම් අංශයේ සියලුම කාණ්ඩයන්ට මූර්ත වැටුප් මට්ටමින් ගත් කළ පාඩු විඳීමට සිදුවිය. 2005 සඳහා වූ උද්ධමනය හා ගැලපූ විට, ගොඩනැගිලි ඉදිකිරීම් අංශයේ මූර්ත වැටුප් වෙනස්වීම් සියයට -8 සිට -3 දක්වා පරාසයකින් සිදුවිය.

6 රාජ්‍ය අංශයට හා සංවිධිත පෞද්ගලික අංශයට නොවැටෙන සියලුම සේවකයින්ගෙන් අසංවිධිත පෞද්ගලික අංශය සමන්විත වේ.

**4.7 සංඛ්‍යා සටහන**

**ක්ෂේත්‍රය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව අසංවිධිත පෞද්ගලික අංශයේ දෛනික වැටුප්(අ)**

| අංශය | වාර්ෂික සාමාන්‍යය (රු.) | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | නාමික | | මූර්ත | |
| | 2003 | 2004 | 2005(ආ) | 2004 | 2005(ආ) | 2004 | 2005(ආ) |
| **1. කෘෂිකාර්මික අංශය** | | | | | | | |
| තේ | | | | | | | |
| පුරුෂ | 276 | 304 | 300 | 10.4 | -1.3 | 2.8 | -12.9 |
| ස්ත්‍රී | 199 | 218 | 217 | 9.5 | -0.5 | 1.9 | -12.1 |
| රබර් | | | | | | | |
| පුරුෂ | 278 | 304 | 306 | 9.1 | 0.8 | 1.5 | -10.8 |
| ස්ත්‍රී | 214 | 229 | 232 | 6.9 | 1.3 | -0.7 | -10.3 |
| පොල් (ඇ) | | | | | | | |
| පුරුෂ | 335 | 367 | 388 | 9.3 | 5.8 | 1.7 | -5.8 |
| වී | | | | | | | |
| පුරුෂ | 304 | 345 | 361 | 13.6 | 4.5 | 6.0 | -7.1 |
| ස්ත්‍රී | 230 | 260 | 261 | 12.9 | 0.6 | 5.3 | -11.0 |
| **2. ඉදිකිරීම් අංශය (ඇ)** | | | | | | | |
| වඩුකාර්මික | | | | | | | |
| වඩුකාර්මික - පිරිමි | 470 | 516 | 557 | 9.7 | 7.9 | 2.1 | -3.7 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 322 | 356 | 368 | 10.5 | 3.5 | 2.9 | -8.1 |
| පෙදරේරු | | | | | | | |
| පෙදරේරු - පිරිමි | 466 | 510 | 553 | 9.5 | 8.6 | 1.9 | -3.0 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 320 | 354 | 369 | 10.7 | 4.2 | 3.1 | -7.4 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2004 ජූනි මාසය දක්වා වැටුප් තොරතුරු මධ්‍යස්ථාන 93ක මාසික වැටුප් තොරතුරු පදනම් කොට ගෙන සකස් කර ඇත. 2004 ජූලි මාසයේ සිට උතුරු හා නැගෙනහිර පළාත්වල නව මධ්‍යස්ථාන 14ක වැටුප් තොරතුරු ද ඇතුලත් කර යාවත්කාලීන කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) පොල් වගා හා ඉදිකිරීම් අංශවල කාන්තා සහභාගීත්වය ඉතා අඩුය.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය

### ජනගහනය

- **2005 වර්ෂයේදී රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් ඇස්තමේන්තු කළ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 19.7 ක් වූ අතර, මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 1.1 ක වර්ධනයකි.** අවුරුදු 15 ට අඩු, අවුරුදු 15-54 හා අවුරුදු 55 සහ ඊට වැඩි වයස් කාණ්ඩ තුනෙහි ජනගහන වර්ධන අනුපාතයන් මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධන අනුපාතයට සමාන විය. මුලතිව් හැර අනෙක් සෑම දිස්ත්‍රික්කයක්ම ජනගහන වර්ධනය සඳහා දායක විය. කොළඹ, මහනුවර, කුරුණෑගල, ගම්පහ සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ජනගහනයේ ඉහළ වර්ධනයන් වාර්තා වූ අතර, මුළු ජනගහනයෙන් සියයට 30 ක් කොළඹ, ගම්පහ හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවල අන්තර්ගත වේ. 2005 වර්ෂයේ මුලතිව් දිස්ත්‍රික්කයෙහි සියයට 2.1 ක ජනගහන අඩුවීමක් දක්නට ඇත. එයට එක් හේතුවක් වශයෙන් සුනාමි ව්‍යසනය නිසා වෙරළබඩ ජනතාව පිට ප්‍රදේශවලට සංක්‍රමණය වීම සැළකිය හැකිය. මුලතිව්හි ජනගහනය අඩුවීම පළාතේ වූ අසල්වැසි දිස්ත්‍රික්ක දෙකක් වන කිලිනොච්චිය හා වව්නියාවල ජනගහන වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කෙරිණි.

**4.8 සංඛ්‍යා සටහන**

**දිස්ත්‍රික්ක මට්ටමින් ජනගහනය**

පුද්ගලයින් දහස් ගණනින්

| දිස්ත්‍රික්කය | 2004 | 2005 (අ) | වෙනස | වෙනස (%) |
|---|---|---|---|---|
| කොළඹ | 2,342 | 2,382 | 40 | 1.7 |
| මහනුවර | 1,325 | 1,343 | 18 | 1.4 |
| රත්නපුරය | 1,049 | 1,060 | 11 | 1.0 |
| බදුල්ල | 813 | 825 | 12 | 1.5 |
| කුරුණෑගල | 1,486 | 1,498 | 12 | 0.8 |
| ගම්පහ | 2,099 | 2,111 | 12 | 0.6 |
| ගාල්ල | 1,020 | 1,030 | 10 | 1.0 |
| අනුරාධපුරය | 773 | 782 | 9 | 1.2 |
| කළුතර | 1,085 | 1,094 | 9 | 0.8 |
| මාතර | 788 | 795 | 7 | 0.9 |
| නුවරඑළිය | 722 | 729 | 7 | 1.0 |
| අම්පාර | 613 | 618 | 5 | 0.8 |
| මඩකලපුව | 544 | 549 | 5 | 0.9 |
| පුත්තලම | 728 | 737 | 9 | 1.2 |
| යාපනය | 596 | 603 | 7 | 1.2 |
| මාතලේ | 459 | 466 | 7 | 1.5 |
| ත්‍රිකුණාමලය | 383 | 388 | 5 | 1.3 |
| හම්බන්තොට | 538 | 542 | 4 | 0.7 |
| මොණරාගල | 410 | 415 | 5 | 1.2 |
| පොළොන්නරුව | 372 | 377 | 5 | 1.3 |
| මුලතිව් | 144 | 141 | -3 | -2.1 |
| කිලිනොච්චිය | 143 | 145 | 2 | 1.4 |
| වව්නියාව | 142 | 145 | 3 | 2.1 |
| කෑගල්ල | 791 | 794 | 3 | 0.4 |
| මන්නාරම | 97 | 99 | 2 | 2.1 |
| **එකතුව** | **19,462** | **19,668** | **206** | **1.1** |

(අ) තාවකාලික	මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව


**ශ්‍රම බලකාය**

- **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රමබලකා සමීක්ෂණය මගින් සේවා නියුක්ත හා සේවා වියුක්ත පුද්ගලයින්ගේ එකතුව වන ශ්‍රම බලකාය ඇස්තමේන්තු කරනු ලැබේ.** කෙසේ වුවද, සුනාමි හේතුවෙන්, 2005 වර්ෂයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් කාර්තුමය ශ්‍රමබලකා සමීක්ෂණය නොපැවැත්විය. ඊට හේතුවූයේ 2005 වර්ෂයේ මුල් භාගයේදී, රටෙහි සුනාමි බලපෑ ප්‍රදේශවල නියැදි රාමුවක් නොතිබීම හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු නිලධාරීන් සුනාමි සම්බන්ධ සමීක්ෂණ කටයුතුවල නියැලීමයි. එබැවින් 2005 වර්ෂයේ මැද වනවිට, නව නියැදි රාමුව ප්‍රයෝජනයට ගනිමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2005 අගෝස්තු මාසයේදී මුළු රටම ආවරණය වන පරිදි එක් විශේෂ ශ්‍රමබලකා සමීක්ෂණයක් පැවැත්විය. මෙම විශේෂ සමීක්ෂණය සුනාමි බලනොපෑ ප්‍රදේශවල කුටුම්භ 4,300 ක් හා සුනාමි බලපෑ ප්‍රදේශවල කුටුම්භ 1,050 කින් සමන්විත වූ අතර, සංසන්දනාත්මකව කාර්තුමය ශ්‍රමබලකා සමීක්ෂණයෙහි නියැදිය වර්ෂයක් තුළ සෑම කාර්තුවකම කුටුම්භ 4,000 ක් පමණ විය.
- **වයස අවුරුදු 10 හෝ ඊට වැඩි රැකියාවක් කළ හැකි හා කිරීමට කැමති පුද්ගලයින් සංඛ්‍යාව ලෙස නිර්වචනය කරනු ලබන ශ්‍රම බලකාය. 2004 තුන්වන කාර්තුවේ මිලියන 7.98 ක් විය[7]. 2005 වර්ෂයේදී කරන ලද විශේෂ ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, එය සියයට 8.14 දක්වා ඉහළ ගොස් ඇත.** 2003 හා 2004 වර්ෂ හා සමහ සැසඳීමේදී 2005 වර්ෂයේ ශ්‍රමබලකායේ වර්ධනය

7. 2002 වර්ෂය අවසානය දක්වා කාර්තුමය ශ්‍රමබලකා සමීක්ෂණය සඳහා උතුරු හා නැගෙනහිර පළාත් ඇතුලත් නොවුණි. 2003 වර්ෂය පළමු කාර්තුවේ සිට නැගෙනහිර පළාතද ඇතුලත් වූ අතර, 2004 වර්ෂය පළමු කාර්තුවේ සිට උතුර පළාතද අදියර කිහිපයක් යටතේ ඇතුළත් විය.

**4.4 රූප සටහන**

**ශ්‍රම බලකාය සහ විරැකියාවේ ප්‍රවණතාවයන් 2001-2005**




ආන්තික වූ අතර, එම වර්ෂවලදී පිළිවෙලින් නැගෙනහිර හා උතුරු පළාත් ඇතුළත්වීමත් සමහ නියැදි ආවරණය පුළුල් විය. තවද, 2004 වර්ෂය අවසානයේ සිදුවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් සිදුවූ ජීවිත හානිය නිසාද 2005 වර්ෂයේදී ශ්‍රම බලකායේ ඉහළයෑම සීමාවුණි. 2005 වර්ෂයේ ශ්‍රමබලකාය, සේවා නියුක්තිකයින් මිලියන 7.52 ක් හා සේවා වියුක්තිකයින් මිලියන 0.62 කින් සමන්විත විය.

- **2004 වර්ෂයේ තුන්වන කාර්තුවේ සියයට 47.8 ක් වූ ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතිකය[8] 2005 අගෝස්තු මාසයේදී සියයට 48.3 දක්වා ඉහළ නැගුණි.** මෙම ඉහළයාම සඳහා ප්‍රධාන වශයෙන් 2004 වර්ෂයේ තුන්වන කාර්තුවේ සියයට 65.7 ක් වූ පුරුෂ සහභාගිත්ව අනුපාතිකය 2005 වර්ෂයේදී සියයට 67.1 ක් දක්වා වැඩිවීම හේතුවිය. මෙම කාලපරිච්ඡේදය තුළ ස්ත්‍රී

8. ශ්‍රම බලකාය, අවු. 10 හා ඊට වැඩි කුටුම්භ ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස.

**4.9 සංඛ්‍යා සටහන**

**කුටුම්භ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය**

| ශීර්ෂය | 2002(අ) | 2003(ආ) | 2004(ඇ) | | | | | 2005(ඈ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සිව්වන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | සුනාමි බල- නොපෑ ප්‍රදේශ | සුනාමි බලපෑ ප්‍රදේශ |
| **කුටුම්බ ජනගහනය (ඉ) පුද්ගලයන් '000** | **14,272** | **15,785** | **16,593** | 16,316 | 16,525 | 16,702 | 16,710 | **16,871** | 16,214 | 657 |
| **ශ්‍රම බලකාය පුද්ගලයන් '000** | **7,219** | **7,835** | **8,061** | 7,987 | 8,038 | 7,984 | 8,162 | **8,141** | 7,859 | 282 |
| සේවා නියුක්ත | **6,677** | **7,215** | **7,394** | 7,337 | 7,314 | 7,305 | 7,495 | **7,518** | 7,269 | 249 |
| සේවා වියුක්ත | **542** | **620** | **667** | 650 | 724 | 679 | 667 | **623** | 590 | 33 |
| **ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඊ) %** | **50.6** | **49.6** | **48.6** | 49.0 | 48.6 | 47.8 | 48.8 | **48.3** | 48.5 | 43.0 |
| පුරුෂ | **68.5** | **68.0** | **66.7** | 67.4 | 67.7 | 65.7 | 67.0 | **67.1** | 67.1 | 66.2 |
| ස්ත්‍රී | **33.9** | **32.0** | **31.5** | 31.4 | 30.8 | 31.0 | 31.7 | **30.9** | 31.2 | 21.8 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) 2002 සිව්වන කාර්තුව දක්වා උතුරු හා නැගෙනහිර පළාත් ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත් කර නොමැත.
(ආ) 2003 පළමු කාර්තුවේ සිට ශ්‍රම බලකා සමීක්ෂණයට නැගෙනහිර පළාත් ඇතුළත් කර ඇති අතර, උතුරු පළාත තවදුරටත් සමීක්ෂණය සඳහා ඇතුළත් කර නොමැත.
(ඇ) 2004 පළමු කාර්තුවේ සිට ශ්‍රම බලකා සමීක්ෂණයට වව්නියාව, කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක හැර උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළත් කර ඇති අතර, 2004 දෙවන කාර්තුවේ සිට සියලුම දිස්ත්‍රික්ක සමීක්ෂණය සඳහා ඇතුළත් කර ඇත. එසේ වුවත් 2004 වාර්ෂික ඇස්තමේන්තු සඳහා මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක ඇතුළත් කර නොමැත.
(ඈ) 2005 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය එක් වරක් පමණක් අගෝස්තු මාසයේදී පවත්වන ලදී.
(ඉ) වයස අවු.10 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ඊ) ශ්‍රම බලකාය කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

සහභාගිත්ව අනුපාතිකය ආන්තික ලෙස පහළබැසීම සමස්ත සහභාගිත්ව අනුපාතිකය අඩු මට්ටමක තිබීමට බලපාන ලදි. පෙර වර්ෂයන් සැළකීමේදී ස්ත්‍රී සහභාගිත්ව අනුපාතිකය මෙන් දෙගුණයක් ලෙස පුරුෂ සහභාගිත්ව අනුපාතිකය පැවතීම මගින් ස්ත්‍රී - පුරුෂ විෂමතාවය පෙන්නුම් කරන අතර, මෙම ප්‍රවණතාවය 2005 වර්ෂයේදීද තවදුරටත් පැවතුණි. තවද, බලාපොරොත්තු වූ පරිදි සුනාමි බලපෑ ප්‍රදේශවල සහභාගිත්ව අනුපාතිකය සියයට 43 ක් වූ අතර, එය රටේ අනෙකුත් ප්‍රදේශ හා සසඳන කල යම් ප්‍රමාණයක අඩු අගයකි. තවද, පෙර වසරවල පැවති සියයට 48 - 52 ක මට්ටමට වඩා එය අඩුවිය.

### සේවා නියුක්තිය

- **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සේවා නියුක්ති සමීක්ෂණ මගින් යම් පුද්ගලයෙකු, පැයක් හෝ ඊට වැඩි කාලයක් ගෙවීමකට, ලාභයකට හෝ ගෙවීමක් නොලබා පවුලේ ආර්ථික අභිවෘද්ධිය සඳහා සමීක්ෂණය සිදුකරන දවසේ සිට සතියකට ප්‍රථම කාලපරිච්ඡේදය තුළ රැකියාවක නියුක්ත නම් එම පුද්ගලයා සේවා නියුක්තිකයෙකු ලෙස හැඳින්වෙයි.** අසනීපයෙන් පසුවීම, අයහපත් කාලගුණය හෝ කාර්මික ආරවුල් නිසා තාවකාලිකව සේවයට වාර්තා නොකළ පුද්ගලයින්ද සේවා නියුක්තිකයින් ලෙස සැළකේ. විශේෂ ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, 2005 අගෝස්තු වලදී සුනාමි බලනොපෑ ප්‍රදේශවල සේවා නියුක්ති අනුපාතිකය සියයට 92.5 ක් විය. සුනාමි බලපෑ ප්‍රදේශ වල වැඩකරන වයස් සීමාවට අයත් ජනගහනය මුළු වැඩකරන වයස් සීමාවට අයත් ජනගහනයෙන් සියයට 4.0 කට මදක් අඩු අගයක් විය. එම නිසා සුනාමි බලපෑ ප්‍රදේශවල සේවා නියුක්ති අනුපාතිකය සියයට 88.2 ක අඩු මට්ටමක පැවතුනද, එමගින් 2004 වර්ෂයේ තුන්වන කාර්තුවේ වූ සියයට 91.5 හා සසඳන කළ 2005 වර්ෂයේ සියයට 92.3 ක් වූ සමස්ත සේවා නියුක්ති අනුපාතිකය කෙරෙහි අවම බලපෑමක් ඇති කෙරිණි.

- **සුනාමි තදින් බලපෑ හෝටල්, ධීවර සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශවල 2005 වර්ෂයේදී ඉහළ සේවා නියුක්ති අඩුවීමක් අපේක්ෂා කළද එහි බලපෑම එතරම් ප්‍රබල නොවීය.** ආර්ථික ප්‍රසාරණය හා බලපෑමට ලක්වූ අංශ නැවත යථා තත්ත්වයට පත්වීමද, ඊට අමතරව 2005 වර්ෂය පුරා සිදුවූ පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළත් ඉදිකිරීම් අංශයේ ඇතිවූ වර්ධනයද හේතුවෙන් රැකියා අවස්ථා අහිමි වූ ප්‍රමාණයට වඩා වැඩියෙන් උත්පාදනය විය. 2005 වර්ෂයේ අගෝස්තු මස පැවැත්වූ විශේෂ ශ්‍රමබලකා සමීක්ෂණයේදී ඇස්තමේන්තු කළ ඉහළ සේවා නියුක්ති අනුපාතිකය මගින් මෙය තවදුරටත් පැහැදිළි වේ. ඉදිකිරීම් අංශයේ සේවා නියුක්ති දයකත්වය 2004 වර්ෂයේ තුන්වන කාර්තුවේ වූ සියයට 4.7 සිට 2005 වර්ෂයේදී සියයට 6.1 දක්වා ඉහළයාම තුළින් 2005 වර්ෂය තුළදී ඉදිකිරීම් අංශයේ වූ ඉහළ වර්ධනය පිළිබිඹු විය. තවද, නිමැවුම් කර්මාන්ත අංශයේ වාර්තා වූ සියයට 6.0 ක වර්ධනයට සමාන්තරව, නිමැවුම් කර්මාන්ත අංශයේ සේවා නියුක්ති දායකත්වයෙහිද ඉහළයෑමක් දක්නට ලැබුණි. 2004 වර්ෂයේ තුන්වන කාර්තුව හා සසඳන විට, 2005

**4.10 සංඛ්‍යා සටහන**

**ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය**

| අංශය | පුද්ගලයන් දහස් | | | | | | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2004(අ) | | | | | 2005(ආ) | 2004 | 2005 |
| | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | තෙවන කාර්තුව | තෙවන කාර්තුව |
| **කෘෂිකර්මය** | **2,475** | **2,355** | **2,608** | **2,492** | **2,586** | **2,306** | **34.1** | **30.7** |
| **කර්මාන්ත** | **1,689** | **1,625** | **1,630** | **1,564** | **1,716** | **1,843** | **21.4** | **24.5** |
| නිමැවුම් කර්මාන්ත | 1,307 | 1,242 | 1,239 | 1,221 | 1,279 | 1,385 | 16.7 | 18.4 |
| ඉදිකිරීම් | 382 | 383 | 390 | 344 | 437 | 458 | 4.7 | 6.1 |
| **සේවා** | **3,230** | **3,357** | **3,076** | **3,248** | **3,195** | **3,369** | **44.5** | **44.8** |
| වෙළඳාම සහ හෝටල් ආදිය | 1,031 | 1,141 | 961 | 1,013 | 1,042 | 1,043 | 13.9 | 13.9 |
| ප්‍රවාහන, ගබඩා කිරීම සහ සන්නිවේදනය | 417 | 401 | 460 | 418 | 409 | 485 | 5.7 | 6.5 |
| මූල්‍ය, රක්ෂණ සහ නිශ්චල දේපල | 176 | 171 | 193 | 187 | 158 | 234 | 2.6 | 3.1 |
| පෞද්ගලික සේවා සහ අදළ වෙනත් සේවා (ඇ), (ඈ) | 1,606 | 1,644 | 1,461 | 1,630 | 1,586 | 1,607 | 22.3 | 21.4 |
| | 7,394 | 7,337 | 7,314 | 7,305 | 7,495 | 7,518 | 100 | 100 |
| | 91.7 | 91.9 | 91.0 | 91.5 | 91.8 | 92.3 | | |

මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) 2004 පළමු කාර්තුවේ සිට ශ්‍රම බලකා සමීක්ෂණයට වව්නියාව, කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක හැර උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළත් කර ඇති අතර, 2004 දෙවන කාර්තුවේ සිට සියලුම දිස්ත්‍රික්ක සමීක්ෂණය සඳහා ඇතුළත් කර ඇත. එසේ වුවත් 2004 වාර්ෂික ඇස්තමේන්තු සඳහා මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක ඇතුළත් කර නොමැත.

(ආ) 2005 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය එක් වරක් පමණක් අගෝස්තු මාසයේ දී පවත්වන ලදී.

(ඇ) 2002 පළමු කාර්තුවේ සිට ශ්‍රම බලකා සමීක්ෂණයේදී පතල් හා කැනීම් උප අංශ පෞද්ගලික සේවා හා වෙනත් සේවා යටතේ වර්ගීකරණය කර ඇත.

(ඈ) 2002 පළමු කාර්තුවේ සිට ශ්‍රම බලකා සමීක්ෂණයේදී විදුලිය, ගෑස් හා ජලය උප අංශ පෞද්ගලික සේවා සහ වෙනත් සේවා යටතේ වර්ගීකරණය කර ඇත.

**4.11 සංඛ්‍යා සටහන**

**සේවා නියුක්ති මූලයන්**

(ප්‍රතිශතය)

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයින් | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2004 (අ) | **13.0** | **46.4** | **2.9** | **28.3** | **9.4** | **100** |
| පළමු කාර්තුව | 13.8 | 47.3 | 2.8 | 27.6 | 8.5 | 100 |
| දෙවන කාර්තුව | 12.4 | 47.0 | 3.3 | 28.8 | 8.5 | 100 |
| තෙවන කාර්තුව | 12.9 | 47.2 | 2.4 | 28.7 | 8.8 | 100 |
| සිව්වන කාර්තුව | 12.2 | 46.7 | 2.4 | 28.8 | 9.9 | 100 |
| **2005 (ආ)** | **13.3** | **46.1** | **3.1** | **29.7** | **7.9** | **100** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) 2004 පළමු කාර්තුවේ සිට ශ්‍රම බලකා සමීක්ෂණයට වව්නියාව, කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක හැර උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළත් කර ඇති අතර, 2004 දෙවන කාර්තුවේ සිට සියලුම දිස්ත්‍රික්ක සමීක්ෂණය සඳහා ඇතුළත් කර ඇත. එසේ වුවත් 2004 වාර්ෂික ඇස්තමේන්තු සඳහා මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක ඇතුළත් කර නොමැත.

(ආ) 2005 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය එක් වරක් පමණක් අගෝස්තු මාසයේ දී පවත්වන ලදී.

වර්ෂයේ සේවා අංශයේ සේවා නියුක්ති දයකත්වය ඉහළයෑම ආන්තික වුවද එම කාලපරිච්ඡේදය තුළ සේවා අංශයෙහි සේවා නියුක්තිය 120,000 කින් පමණ ඉහළගොස් ඇත. මේ සඳහා ගමනාගමන, ගබඩාකිරීම් හා සන්නිවේදනය, මූල්‍ය, රක්ෂණ හා නිශ්චල දේපල යන උප අංශවලද සේවා නියුක්ති වැඩිවීම දයක වූ අතර, මෙම වැඩිවීම එම උප අංශවල වර්ධනයන් මගින්ද පිළිබිඹු වේ. සුනාමි ව්‍යසනය තදින් බලපෑ වෙළඳ හා හෝටල් අංශයේ සේවා නියුක්ති දයකත්වය 2004 වර්ෂයේ තුන්වන කාර්තුව හා සමාන මට්ටමක 2005 වර්ෂයේදීද රඳවා තබාගැනීමට තරම් ප්‍රමාණවත් වේගයකින් එම අංශ යථා තත්ත්වයට පත්වුණි. කෙසේ වෙතත් පෞද්ගලික සේවා හා අදළ වෙනත් සේවා අංශයේ සේවා නියුක්ති දයකත්වය හා සේවා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව යන දෙකෙහිම පහතවැටීමක් සිදුවුවද, 2005 වර්ෂයෙහි උපාධිධාරීන් බඳවාගැනීමේ වැඩසටහන යටතේ ලබාදුන් ස්ථිර ගුරු පත්වීම් නිසා එම අංශයට අයත් අධ්‍යාපන උප අංශයෙහි සේවා නියුක්තියේ සැළකිය යුතු ඉහළයාමක් දක්නට ලැබුණි.

- **විශේෂයෙන් දේශීය කෘෂිකර්මාන්තයේ හිතකර වර්ධනයක් තිබියදීත්, දුව ආදී වන ද්‍රව්‍ය හා ධීවර යන උප අංශ අඩංගු කෘෂිකාර්මාන්ත අංශයේ සේවා නියුක්ති දයකත්වය 2004 වර්ෂයේ තුන්වන කාර්තුවේ සියයට 34.1 සිට 2005 වර්ෂයේදී සියයට 30.7 දක්වා පහත වැටුණි**. මෙම සේවා නියුක්තියේ පහතවැටීමට හේතු වශයෙන් කෘෂිකර්ම උප අංශවල අතිරික්ත ශ්‍රමිකයින් විශේෂයෙන්ම සුනාමි හා සම්බන්ධ ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් ඇතුළු අනෙකුත් අංශවල ඉහළ ඉල්ලුමක් ඇති රැකියා සඳහා යොමුවීම දැක්විය හැකිය. මෙම ශ්‍රමිකයින්ගේ යොමුවීම 2005 වර්ෂයේ කෘෂිකාර්මික උප අංශයන්හි වගාවන් වල නිෂ්පාදන මට්ටම් කෙරෙහි එතරම් බලපෑමක් ඇති නොවීමට හේතු වූයේ ආරම්භයේ සිට අස්වනු සැකසීම දක්වා විවිධ අවස්ථාවන්හිදී තාක්ෂණය උපයෝගී කරගැනීමයි. කෙසේ නමුත් ධීවර උප අංශය බලාපොරොත්තු වූවාට වඩා යම්තාක් දුරට වේගයෙන් යථාතත්වයට පත්වෙමින් තිබුණද සේවා නියුක්තිය 2004 වර්ෂයට වඩා අඩු මට්ටමක පැවතිණි. මෙලෙස සාපේක්ෂ වශයෙන් කෘෂිකර්ම හා ධීවර උප අංශ දෙකෙහිම වූ අඩු සේවා නියුක්ති මට්ටම් මගින් 2005 වර්ෂයේ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්ති දයකත්වයෙහි පහතවැටීමක් පිළිබිඹු කෙරිණි.

- **විශේෂ ශ්‍රමබලකා සමීක්ෂණයට අනුව, සමස්ත සේවා නියුක්ති මූලයන් අතරේ පුද්ගලික අංශයේ සේවා නියුක්ති දයකත්වය 2004 වර්ෂයේ තුන්වන කාර්තුවේදී වූ සියයට 47.2 සිට 2005 වර්ෂයේ සියයට 46.1 දක්වා වැඩීම පහතවැටීම පෙන්නුම් කළේය**. තවද ගෙවීමක් නොලද පවුලේ සාමාජිකයින්ගේ දයකත්වයෙහිද පහත වැටීමක් 2005 වර්ෂයේදී වාර්තා විය. ඊට ප්‍රතිවිරුද්ධව පුද්ගලික අංශයේ සේව්‍යයන් හා ස්වයංරැකියාවල නියුක්තවූවන්ගේ සේවා නියුක්ති දයකත්වය ඉහළ නැගුණි. 2005 වර්ෂයේදී මෙම එක් එක් කාණ්ඩවල දයකත්වයෙහි වැඩිවීම රාජ්‍ය අංශයේ දයකත්වය වැඩිවීමට වඩා 2004 වර්ෂයේ තුන්වන කාර්තුව හා සැසඳීමේදී වැඩි විය. රාජ්‍ය අංශයේ උපාධිධාරී රැකියා වැඩසටහන ක්‍රියාත්මක වෙමින් තිබියදී පවා මෙම වැඩිවීම වාර්තා විය.

- **රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ඉහළනැංවීමේ රජයේ ප්‍රතිපත්තිය. 2004 වර්ෂයේ හතරවන කාර්තුවේදී ආරම්භ වූ උපාධිධාරී රැකියා වැඩසටහන තුළින් දියත් කළ අතර, එය රාජ්‍ය අංශයේ සේවා නියුක්ති දයකත්වය ඉහළනැංවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදි**. ආරම්භයේදී රජය විසින් උපාධිධාරීන් 42,000 ක් මුදල් අමාත්‍යාංශය යටතේ වූ විශේෂ ව්‍යාපෘතියක් මගින් පුහුණු කිරීමෙන් අනතුරුව, 2005 වර්ෂයේ පළමු කාර්තු තුන ඇතුළත විවිධ රාජ්‍ය ආයතනවල ස්ථිර පත්වීම් ලබාදෙන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම උපාධිධාරී පුහුණු වැඩසටහන යටතේ පුහුණු වූ 42,000 ක පමණ උපාධිධාරීන්, 2005 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයේ සිට රාජ්‍ය අංශයේ විවිධ ආයතනවලට විතැන්වීමක් දක්නට ලැබුණි. අලුතෙන් බඳවා ගැනීම්, විශේෂයෙන්ම 2004 වර්ෂයේ උපාධිධාරී රැකියා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නිසා රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව

**4.12 සංඛ්‍යා සටහන**
**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| | 2003 | 2004 | 2005(අ) | වෙනස (%) '03/'04 | වෙනස (%) '04/'05 |
|---|---|---|---|---|---|
| රාජ්‍ය (ආ) | 785,756 | 842,255 | 850,321 | 7.2 | 0.9 |
| අර්ධ රාජ්‍ය (ඇ) | 257,452 | 252,659 | 253,922 | -1.9 | 0.5 |
| සමස්ත රාජ්‍ය අංශය | 1,043,208 | 1,094,914 | 1,104,243 | 5.0 | 0.8 |

(අ) තාවකාලික
(ආ) මධ්‍යම රජය, පළාත් සභා හා ප්‍රාදේශීය සභා
(ඇ) රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු කිරීම සඳහා සෘජුවම යොදා ගැනුණු 2002 ඔක්තෝබර් මස 24 දිනැති අංක 16(1) දරණ කළමණාකරන චක්‍රලේඛය අවලංගු කරන ලදි. කෙසේ වුවද 2005 වර්ෂයේ රාජ්‍ය අංශයේ ආයතන කිහිපයක හැර, විශාල ප්‍රමාණයේ බඳවාගැනීම් කිසිවක් සිදුනොවුණි. 2005 වර්ෂයේදී රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි ආන්තික වැඩිවීමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයෙහි ඇස්තමේන්තු මගින් පිළිබිඹු විය. මෙම සමීක්ෂණයට අනුව රාජ්‍ය අංශයේ එනම් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය, 2004 වර්ෂයේ වූ සියයට 5.0 ක සුවිශේෂ ඉහළයාමට සාපේක්ෂව 2005 වර්ෂයේදී සියයට 0.8 කින් ඉහළ නැගුණි. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශ දෙකම සේවා නියුක්තිය ඉහළයාම සඳහා දායක විය.

- **2005 වර්ෂයේදී මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතනවලින් සමන්විත රජයේ ආයතනවල සේවා නියුක්තිය සියයට 0.9 කින් ඉහළයන ලදී.** මෙයට හේතුව උපාධිධාරී පත්වීම් හැරුණුකොට සෞඛ්‍යය, පෝෂණ හා ශුභසාධන අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය ආයතන කිහිපයක සාපේක්ෂ සමස්ත සේවා නියුක්තිය ඉතා සුළු ප්‍රමාණයකින් ඉහළයෑමයි. මීට ප්‍රතිවිරුද්ධව, 2004 වර්ෂයේදී උපාධිධාරී රැකියා වැඩසටහන යටතේ පුහුණුවන්නන් ලෙස උපාධිධාරීන් 42,000 ක් බඳවාගත් නිසා රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය සියයට 7.2 කින් ඉහළ නැගුණි. ස්වේච්ඡාවෙන් විශ්‍රාමයෑමේ වැඩපිළිවෙල සම්පූර්ණයෙන් නැවතීම හා අර්ධ රාජ්‍ය අංශයට අයත් ලංකා විදුලිබල මණ්ඩලය හා රාජ්‍ය බැංකු දෙක සඳහා නව බඳවාගැනීම් සිදුකළ නිසා 2004 වර්ෂයට සාපේක්ෂව 2005 වර්ෂයේ සේවා නියුක්තිය සියයට 0.5 කින් ඉහළ නැගුණි. තවද අර්ධ රාජ්‍ය ආයතනවල අතිරික්ත සේවකයින් අඩුකිරීමේ අරමුණින් ඇතිකළ ස්වේච්ඡාවෙන් විශ්‍රාමයෑමේ වැඩපිළිවෙල සම්පූර්ණයෙන්ම නැවතුණි. 2001 වර්ෂයේදී ආරම්භ කළ මෙම වැඩපිළිවෙල 2004 වර්ෂයේදී ක්‍රමයෙන් අක්‍රීය විය. මෙම වැඩපිළිවෙලෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2004 වර්ෂයේදී අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සියයට 1.9 කින් පහත වැටුණි.

**සේවා වියුක්තිය**

- **2005 වර්ෂයේ දී සේවා වියුක්ති අනුපාතිකය විශේෂ ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කරන ලද අතර, එය 2004 වර්ෂයේ දී වූ සියයට 8.3 සිට සියයට 7.7 දක්වා පහත වැටුණි.** මෙම පහත වැටීමට හේතුවූයේ 2005 වර්ෂය පුරා තිබූ සමස්ත ආර්ථික වර්ධනය, සුනාමි ව්‍යසනයෙන් නැවත යථාතත්ත්වයට පත්වීම සහ උපාධිධාරී රැකියා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නිසා රැකියා උත්පාදනය වීමයි. 2005 වර්ෂය තුළදී සුනාමි ප්‍රදේශවල සේවා වියුක්ති අනුපාතිකය සියයට 11.8 ක ඉහළ අගයක් වුව ද, සුනාමි ඇති නොවූ ප්‍රදේශවල මිලියන 7.9 ක් වූ ශ්‍රම බලකාය හා සැසඳීමේදී සුනාමි ප්‍රදේශවල වූ ශ්‍රම බලකාය මිලියන 0.3 ක් පමණ වූ නිසා සමස්ත සේවා වියුක්තියට ඉන් ඇතිකරන ලද බලපෑම ආන්තික විය.

**4.13 සංඛ්‍යා සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| ශීර්ෂය | 2004(අ) වාර්ෂික | 2004(අ) පළමු කාර්තුව | 2004(අ) දෙවන කාර්තුව | 2004(අ) තෙවන කාර්තුව | 2004(අ) සිව්වන කාර්තුව | 2005(ආ) වාර්ෂික |
|---|---|---|---|---|---|---|
| සමස්ත | **8.3** | 8.1 | 9.0 | 8.5 | 8.2 | **7.7** |
| ස්ත්‍රී පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | **6.0** | 6.2 | 6.6 | 6.0 | 6.0 | **5.5** |
| ස්ත්‍රී | **12.8** | 12.2 | 14.0 | 13.5 | 12.5 | **11.9** |
| වයස් කාණ්ඩ අනුව (අවුරුදු) | | | | | | |
| 15-19 | **28.3** | 31.7 | 34.2 | 25.8 | 29.5 | **30.8** |
| 20-29 | **19.2** | 17.9 | 19.8 | 21.4 | 18.7 | **17.2** |
| 30-39 | **4.0** | 3.8 | 4.4 | 2.9 | 3.5 | **3.8** |
| 40 සහ ඊට ඉහළ | **1.3** | 1.5 | 1.3 | 1.1 | 1.3 | **1.2** |
| අධ්‍යාපන මට්ටම අනුව | | | | | | |
| 4 ශ්‍රේණිය/5 වසර සහ ඊට පහළ | **2.0** | 2.5 | 2.3 | 1.4 | 1.5 | **1.8** |
| 5-9 ශ්‍රේණිය/6-10 වසර | **6.9** | 7.3 | 8.0 | 6.6 | 7.4 | **6.3** |
| අ.පො.ස. (සා.පෙ)ජා.පො.අ.ස | **12.3** | 11.6 | 12.9 | 14.1 | 12.1 | **11.5** |
| අ.පො.ස. (උ.පෙ)උ.ජා.අ.ස සහ ඊට ඉහළ | **16.8** | 14.6 | 19.0 | 17.3 | 16.8 | **13.8** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) 2004 පළමු කාර්තුවේ සිට ශ්‍රම බලකා සමීක්ෂණයට වව්නියාව, කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක හැර උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළත් කර ඇති අතර, 2004 දෙවන කාර්තුවේ සිට සියලුම දිස්ත්‍රික්ක සමීක්ෂණය සඳහා ඇතුළත් කර ඇත. එසේ වුවත් 2004 වාර්ෂික ඇස්තමේන්තු සඳහා මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක ඇතුළත් කර නොමැත.
(ආ) 2005 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය එක් වරක් පමණක් අගෝස්තු මාසයේදී පවත්වන ලදී.

- **රාජ්‍ය අංශය විසින් ක්‍රියාත්මක කරන ලද උපාධිධාරී රැකියා වැඩසටහන නිසා දිගුකලක් පුරා පැවති උගත් තරුණ පිරිස් අතරේ වූ විරැකියා ප්‍රශ්නය තරමක් දුරට පහව යන ලද අතර, මෙම ක්‍රියාමාර්ගය රට තුළ සමස්ත සේවා වියුක්තිය අඩුකිරීමට ද ඉවහල් විය.** 2004 වර්ෂය හා සැසඳීමේදී සමස්ත අධ්‍යාපන මට්ටම් අතුරින් අ.පො.ස. (සා.පෙ.) හා අ.පො.ස (උ.පෙ.) සහ ඉහළ සුදුසුකම් ඇති කණ්ඩ වල සේවා වියුක්ති අනුපාතිකයේ වැඩිම පහළයාම 2005 වර්ෂය තුළදී වාර්තා විය. එමෙන්ම, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 1990 සිට ආරම්භ කරන ලද කාර්තුමය ශ්‍රමබලකා සමීක්ෂණයට අනුව, අ.පො.ස. (උ.පෙ.) හා ඉහළ සුදුසුකම් ඇති කාණ්ඩයේ අඩුම සේවා වියුක්ති අනුපාතිකය වන සියයට 13.8 මෙවර වාර්තා විය. අ.පො.ස. (උ.පෙ.) හා ඉහළ සුදුසුකම් සහිත පුද්ගලයින්ගෙන් වැඩි කොටසක් අවුරුදු 20-29 අතර වයස් කාණ්ඩයට අයත් වූ අතර, මෙම වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2004 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 21.4 සිට 2005 වර්ෂයේ දී සියයට 17.2 දක්වා පහළයාම තුළින් එම උගත් තරුණයන් අතරේ සේවා වියුක්ති අනුපාතිකය අඩුවීම පැහැදිළි විය.

**විදේශ සේවා නියුක්තිය**

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව 2005 වර්ෂයේ දී විදේශ රැකියා අවස්ථා 230,963 ක් වූ අතර, 2004 හා සැසඳීමේදී එය සියයට 8.2 ක වර්ධනයකි. එම වර්ධනය වසර මැදදී පුරෝකථනය කළ සංඛ්‍යාව වූ 221,000 ඉක්මවා යාමකි.** මෙම වැඩිවීමට හේතු වූයේ 2005 වර්ෂයේ දෙවන භාගයේ සිදු වූ විදේශ රැකියා අවස්ථා වැඩිවීමයි. 2005 වර්ෂයේ ප්‍රථම භාගයේ දී 111,481 වූ විදේශ රැකියා අවස්ථා වර්ෂයේ දෙවන භාගය වන විට 119,482 දක්වා වැඩිවීමට කටාර්, සවුදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සැළකිය යුතු ලෙස දායක වූ අතර, සංක්‍රමණික සේවකයින්ගෙන් සියයට 80 ක් පමණ සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය,. කුවේට් හා කටාර් යන රටවල්වල සේවය කරයි. පුහුණු ශ්‍රමිකයන් සඳහා සැළකිය යුතු ඉහළ ඉල්ලුමක් කටාර්වල තිබූ අතර, ගෘහ සේවිකාවන් සහ නුපුහුණු ශ්‍රමිකයින් සඳහා ද යම් ප්‍රමාණයක ඉහළ ඉල්ලුමක් 2005 වර්ෂය තුළදී දක්නට ලැබුණි. අනෙක් අතට, ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් සඳහා සවුදි අරාබි හා එක්සත් අරාබිය එමීර් රාජ්‍යය මගින් ඇති ඉල්ලුම මුළුමණින්ම පාහේ ගෘහ සේවිකාවන් සඳහා විය.

- **1990 දශකය මැදදී සියයට 25 ක් ලෙස තිබූ පුරුෂ දයකත්වය 2005 වර්ෂයේ දී සියයට 41 දක්වා ඉහළ නැගුණි.** 2005 වර්ෂයේ දී විදේශ රැකියාවල සමස්ත පුරුෂ දයකත්වය ඉහළයාමට පුහුණු සහ නුපුහුණු රැකියා සඳහා පුරුෂයන්හට කටාර් රාජ්‍යයෙන් ඇති වූ ඉල්ලුම මූලික වශයෙන්ම බලපාන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2004 වර්ෂයේ සියයට 63 ක් වූ ස්ත්‍රී දයකත්වය, 2005 වර්ෂයේ දී සියයට 59 දක්වා පහළ වැටුණි. කෙසේ වුවද පහළ ආදායම් කාණ්ඩවලට අයත් වූ ගෘහ සේවිකාවන්, 2004 වර්ෂයේදී සියයට 52 සිට 2005 වර්ෂයේදී සියයට 54 දක්වා ඉහළනැංවුන අතර, සංක්‍රමණික රැකියාවල නියුක්ත ශ්‍රම කාණ්ඩ අතරින් ගෘහ සේවිකාවන් සඳහා ඉහළම ඉල්ලුමක් දක්නට ලැබුණි. මෙහිදී මුළු විදේශ රැකියාවල වැඩිවීම වූ 17,511 න් සියයට 86 ක් ගෘහ සේවිකාවන්ගෙන් සමන්විත විය.

- **කාන්තාවන් තම රටේ පවතින රැකියා අවස්ථා හිඟය නිසා සහ ඉතුරුම් සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නංවාගැනීමේ අපේක්ෂාවෙන් සංක්‍රමණික රැකියා ලෙස විශේෂයෙන් මැදපෙරදිග රටවල්වල ගෘහ සේවය තෝරාගැනීම තවදුරටත් දක්නට ලැබුණි.** මෙම තත්ත්වය වැඩ කරන ස්ථානවල වැඩිවෙමින් පවත්නා ඉහළ අවදානම් සහිත තත්ත්වයන් හා ඔවුන්ගේම පවුල්වල ප්‍රශ්න තිබියදී පවා දක්නට ලැබුණි. තවද, 2005

**4.14 සංඛ්‍යා සටහන**
**විදේශ සේවා නියුක්තිය**

| ශීර්ෂය | 2002 | 2003 | 2004 | 2005(අ) වාර්ෂික | පළමු භාගය | දෙවන භාගය |
|---|---|---|---|---|---|---|
| විදේශ රැකියා සංඛ්‍යාව | 203,773 | 208,808 | 213,453 | 230,963 | 111,481 | 119,482 |
| මූලයන් අනුව (%) | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයින් | 75 | 74 | 73 | 72 | 72 | 71 |
| වෙනත් | 25 | 26 | 27 | 28 | 28 | 29 |
| ස්ත්‍රී/පුරුෂ අනුව (%) | | | | | | |
| පුරුෂ | 35 | 36 | 37 | 41 | 41 | 41 |
| ස්ත්‍රී | 65 | 64 | 63 | 59 | 59 | 59 |
| ශ්‍රම කාණ්ඩ අනුව (%) | | | | | | |
| ගෘහ සේවිකා | 53 | 49 | 52 | 54 | 54 | 54 |
| පුහුණු ශ්‍රමිකයන් | 22 | 23 | 21 | 20 | 20 | 20 |
| නුපුහුණු ශ්‍රමිකයන් | 18 | 21 | 20 | 18 | 18 | 18 |
| වෙනත් | 7 | 7 | 7 | 8 | 8 | 8 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය

### 4.15 සංඛ්‍යා සටහන
### රටවල් අනුව විදේශ සේවා සංක්‍රමණ

| රට | 2004 | | 2005 | | 2004-2005 |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය(%) | සංඛ්‍යාව | දායකත්වය(%) | වෙනස |
| කටාර් | 29,857 | 14.0 | 35,932 | 15.6 | 6,075 |
| සෞදි අරාබියාව | 70,891 | 33.2 | 76,113 | 33.0 | 5,222 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 32,702 | 15.3 | 36,282 | 15.7 | 3,580 |
| කුවේට් | 36,533 | 17.1 | 36,099 | 15.6 | -434 |
| වෙනත් | 43,470 | 20.4 | 46,537 | 20.1 | 3,067 |
| **එකතුව** | 213,453 | 100.0 | 230,963 | 100.0 | 17,510 |

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය

වර්ෂයේදී නුපුහුණු ශ්‍රමිකයින්ගේ විදේශගතවීම් සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණද, මෙම ශ්‍රම කාණ්ඩයට අයත් විදේශ රැකියා ප්‍රමාණය හා එහි දායකත්වය 2004 වර්ෂය හා සැසඳීමේදී අඩුවිය. 2006 අයවැයට අනුව නව රාජ්‍ය ප්‍රතිපත්තීන් යටතේ සංක්‍රමණය වන ශ්‍රමිකයින් හට හඳුන්වාදුන් කුසලතා සංවර්ධනයන් සඳහා දිරිගැන්වීම් නිසා ගෘහ සේවිකාවන් සහ අනෙකුත් නුපුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා පිටත්වීමේ දායකත්වය මෑත අනාගතය තුළ අඩුවේ යැයි අපේක්ෂා කෙරේ.

**ශ්‍රම ඵලදායිතාවය**

- **2005 වර්ෂයේදී ශ්‍රම ඵලදායිතාවය, එක් සේවානියුක්තිකයෙකු සඳහා වාර්ෂිකව එකතු කළ අගය මත පදනම්ව රු. 138,300 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය, 2001-2005 දක්වා කාලය තුළ ඉහළම අගය ලෙස වාර්තා විය.** 2004 වර්ෂය හා සැසඳීමේදී 2005 වර්ෂයේ සමස්ථ ඵලදායිතාවයේ වැඩිවීම ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය වැඩිවීම සහ සේවා අංශයේ සිදුවූ ආන්තික වැඩිවීම මගින් සිදුවිය. 2005 වර්ෂයේදී කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය ඉහළ ගියද, එහි අගය කර්මාන්ත හා සේවා අංශවල ඵලදායිතාවය මෙන් අර්ධයක් හෝ ඊටත් අඩු මට්ටමක පැවතුණි. තවද, 2001 සිට 2005 වර්ෂය දක්වා කාලය තුළ කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය පහළ මට්ටමක පැවතුණි.

### 4.16 සංඛ්‍යා සටහන
### ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව

| | 2001 | 2002 | 2003 | 2004 | 2005(අ) |
|---|---|---|---|---|---|
| **ස්ථාවර (1996) මිල අනුව** | | | | | |
| **ද.දේ.නි. (රු. මිලියන)** | 843,794 | 877,248 | 930,057 | 980,720 | 1,039,735 |
| කෘෂිකර්මය | 169,377 | 173,623 | 176,450 | 175,852 | 178,475 |
| කර්මාන්ත | 231,350 | 233,562 | 246,417 | 259,286 | 280,695 |
| සේවා | 443,067 | 470,063 | 507,191 | 545,582 | 580,564 |
| **මුළු සේවා නියුක්තිය,** | | | | | |
| **පුද්ගලයින් '000** | 6,235 | 6,670 | 7,012 | 7,319 | 7,518 |
| කෘෂිකර්මය | 2,033 | 2,359 | 2,384 | 2,485 | 2,306 |
| කර්මාන්ත | 1,491 | 1,387 | 1,529 | 1,607 | 1,844 |
| සේවා | 2,711 | 2,924 | 3,099 | 3,227 | 3,368 |
| **ශ්‍රම ඵලදායිතාව** | | | | | |
| **එක් පුද්ගලයකු සඳහා රු. '000** | 135.3 | 131.5 | 132.6 | 134.0 | 138.3 |
| කෘෂිකර්මය | 83.3 | 73.6 | 74.0 | 70.8 | 77.4 |
| කර්මාන්ත | 155.2 | 168.4 | 161.2 | 161.3 | 152.2 |
| සේවා | 163.4 | 160.8 | 163.7 | 169.1 | 172.4 |

(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**කම්කරු සබඳතා**

- **2005 වර්ෂය තුළදී වැවිලි අංශයේ වැඩ වර්ජන ගණන, 2004 වර්ෂය හා සංසන්දනාත්මකව සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ යනු ලැබිය.** මෙමගින් සේව්‍ය සේවක සබඳතාවල අභිවෘද්ධියක් පෙන්වාදුනි. මෙම දියුණුවට ප්‍රධාන හේතුවක් වූයේ වැටුප් කේවල් කිරීම් සඳහා ක්‍රමයෙන් සාමූහික ගිවිසුම් කෙරෙ යොමුවීමයි. 2005 වර්ෂයේදී වැවිලි අංශය හැර, අනෙකුත් පුද්ගලික අංශයේ වැඩ වර්ජන, 2004 වර්ෂය හා සසඳනවිට ඉහළ යෑමට මූලිකවම ප්‍රාදේශීය ගමනාගමන සමාගම්වල සේවකයින් 40,000 ක පමණ සහභාගීත්වයෙන් 2005 වර්ෂයේ පළමුවන කාර්තුවේදී දින තුනක් පුරා පැවති වැඩ වර්ජනය හේතුවිය. වර්ෂයේ ඉතිරි කාලපරිච්ඡේදය තුළදී සේවකයින් 5,900 ක් පමණ සහභාගී වූ වැඩ වර්ජන 28 කට පමණක් සීමාවීම කම්කරුවන් තුළ තරමක් සන්සුන් වාතාවරණයක් ඇතිවීමට හේතු විය. මෙලෙස වැඩි සේවක සංඛ්‍යාවක් සහභාගි වූ එක වැඩවර්ජනයකට පමණක් සීමාවීම, සේව්‍ය සේවක සබඳතාවල ඇතිවූ අභිවෘද්ධිය හුවාදක්වන සංඥාවකි. තවද, සමස්ත පුද්ගලික අංශයේ ඵලදායිතාවය වැඩිදියුණු වීම සඳහා කම්කරු සබඳතාවල අභිවෘද්ධිය බලපාන ලදි.

**ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ**

- **කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශය විසින් 2005 මැයි 15 දින සේවය අවසන් කිරීමේ පනතේ (1971) සංශෝධන යටතේ, වන්දි ගෙවීමේ සූත්‍රය සංශෝධනය කරන ලදි.** කම්කරු සබඳතා සහ රැකියා නියුක්ති අමාත්‍යාංශය, වෘත්තීය සංගම් සහ සේව්‍ය නියෝජිතයින්ගෙන් සැදුම්ලත් ජාතික කම්කරු උපදේශන සභාව විසින් රැකියාවලින් ඉවත් කළ සේවකයින්ගේ ආදායම් තත්ත්වයන් නගාසිටුවීම සහ වන්දි සූත්‍රයට සමාන්තරව සේවා නියුක්ත වීමට අවශ්‍ය හැකියාවන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ආරක්ෂණ ජාලයක් පිහිටුවීමට (විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමය) අපේක්ෂා කරන ලදි. කෙසේ වුවද මෙම කාර්යය සඳහා අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ මූලාශ්‍රයන් පිළිබඳව 2005 වර්ෂය තුළදී අවසන් නිගමනයකට නොපැමිණීම නිසා ජාතික කම්කරු උපදේශක සභාවට විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා අවසන් විසඳුමකට එළඹීමට නොහැකි විය.

- **2005 වර්ෂයේ අයවැය යෝජනා යටතේ රාජ්‍ය අංශයේ වැටුප් වැඩිකිරීම් වලට සමාන්තරව 2005 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුද්ගලික අංශයේ වැටුප් රුපියල් 1,000 කින් වැඩිකිරීම සඳහා සේවකයින්ගේ අයවැය සහන දීමනා පනත (2005) පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදි.** කෙසේ වුවද, 2005 ජනවාරි සිට බහුවිධ කෙඳි ගිවිසුම අවලංගු කිරීම සහ වසර මැදදී සේවාදායකයින් සමඟ ගිවිසුම් අලුත්කිරීම හා සම්බන්ධව මුහුණදිය යුතුව තිබූ ප්‍රශ්න හේතුවෙන් ඇඟලුම් හා

**විශේෂ සටහන 8**

## ශ්‍රම ඵලදයිතාවය හා ඌන සේවා නියුක්තිය

2005 වර්ෂයේදී ශ්‍රම ඵලදයිතාවය, එක් සේවා නියුක්තිකයෙකු මගින් වාර්ෂිකව එකතු කළ අගය මත පදනම්ව රු. 138,300 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. 2005 වර්ෂයේ කෘෂි අංශයෙහි එක් සේවා නියුක්තිකයෙකු සඳහා නිෂ්පාදිතය රු. 77,400 ක් වූ අතර, මෙය කර්මාන්ත හා සේවා අංශවලට සාපේක්ෂව භාගයක් හෝ ඊට අඩු අගයකි. (රූප සටහන වි.ස. 8.1) කෘෂිකර්ම අංශයේ ක්‍රියාකාරකම් මූලිකවම ශ්‍රමිකයන් බහුල ග්‍රාමීය අංශයේ සංකේන්ද්‍ර වී ඇත. මෙම අංශයේ සැළකිය යුතු රැකියා අවස්ථා ප්‍රමාණයක් කෙටිකල් පවතින අනියම් රැකියා වන අතර, ඒවා වගා කන්න හා දෛනිකව පවතින අවශ්‍යතාවයන් සමග බැඳේ. එබැවින් අනෙකුත් අංශවලට සාපේක්ෂව කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්තිකයන් වැඩි ප්‍රමාණයක් සම්මත කාල සීමාවට වඩා අඩු ප්‍රමාණයක් ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත වෙයි.


සාමාන්‍යයෙන් පිළිගත් සම්මත හෝ විකල්ප රැකියාවක නියුක්ත කාලයට සාපේක්ෂව කිසියම් පුද්ගලයෙකුගේ රැකියාවේ නියුක්ත කාලය අඩු මට්ටමක පැවතීම ඌණ සේවා නියුක්තියක් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වන ලද පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව, යම් පුද්ගලයෙකු සම්මත කාලසීමාවට වඩා අඩු ප්‍රමාණයකින් සේවානියුක්ත වේ නම් හා දීර්ඝකාලීනව අමතර වැඩ සොයමින් හෝ බාරගැනීමට සූදානම් වී සිටින අයෙක් නම්, ඌණ සේවා නියුක්තිකයෙක් ලෙස සැළකේ. මෙම අර්ථ දැක්වීමට අනුව යම් පුද්ගලයෙකු විවේක නිවාඩු මත, අසනීපව හෝ ශාරීරික දුබලතාවයක් නිසා සම්මත කාලසීමාවට වඩා අඩුවෙන් සේවයේ යෙදෙන්නෙකු ඌණ සේවා නියුක්තිකයෙකු ලෙස නොසැළකේ. ඒ අනුව ඌණ සේවා නියුක්ති අනුපාතය මුළු ශ්‍රම බලකායෙන් සියයට 21.6 කි. මුළු සේවා නියුක්ති පුද්ගලයින්ගෙන්, ඌණ සේවා නියුක්තිය සියයට 23.7 කි. (සංඛ්‍යා සටහන වි.ස. 8.1) කෘෂිකර්මාන්ත අංශයේ ඌණ සේවා නියුක්තිය 2003/04 දී ඉහළම මට්ටමක පැවති අතර එය 1996/97 හා සසඳන කළ අනෙකුත් අංශවලට වඩා වැඩි වේගයකින් ඉහළ නැගුණි. ඒ අතරතුර සේවා අංශයේ හා අනෙකුත් සියළුම අංශවල ඌණ සේවා නියුක්තිය පහත වැටුණි. තවද, කෘෂිකාර්මික අංශය සඳහා සාපේක්ෂ ඉහළ සේවා නියුක්ති දායකත්වයක් ඇති ස්ත්‍රී සේවකයින් අතර ඌණ සේවා නියුක්තිය ඉහළ මට්ටමක පැවතිණි.

පුළුල් වන ආර්ථිකය නව රැකියා අවස්ථා ජනනය කරනු ලබන අතර, මෙම රැකියා අවස්ථා මගින් වැඩිපුර ශ්‍රමිකයන් ග්‍රහණය කරනු පමණක් නොව දැනට කෘෂිකර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල නියුතු සේවකයින්ට එම ක්‍රියාකාරකම්වල වැඩිපුර කාලයක් නිරතවීමට හැකිවීම තුළින් ඌණ සේවානියුක්තිය අඩුවී අංශයේ ඵලදයිතාවය වැඩිවනු ඇත. මේ අතර, ආර්ථික පුළුල්වීම හා ඇඳුන නිපුණතා වර්ධන පුහුණු වැඩ සටහන් මගින් කෘෂිකර්මාන්ත අංශයේ වූ අතිරික්ත ශ්‍රමය විතැන් වීම තවදුරටත් ශක්තිමත් විය හැක.

2005 වර්ෂයේදී කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය පහළ ගියද, එම අංශයේ නිෂ්පාදනයේ යහපත් වර්ධනයක් දක්නට ලැබුණි. මෙයට හේතු වූයේ රැකියා විරහිත කම්කරු කොටස් විශේෂයෙන්ම සුනාමි ව්‍යසනය නිසා හටගත් ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන කටයුතු නිසා බිහි වූ ඉදිකිරීම් අංශයට විතැන්වීමයි. කෘෂිකාර්මික සේවා නියුක්තියේ පහළ බැසීමක් දක්නට ලැබුණද, වගා ආරම්භයේ සිට අස්වනු සැකසීම දක්වා විවිධ අවස්ථාවන්හිදී තාක්ෂණය යොදා ගැනීම කෘෂි නිෂ්පාදනයන්හි වර්ධන වේගය වැඩිවීමට ඉවහල් විය.

**රූප සටහන වි.ස. 8.1**

**මූලික ආර්ථික අංශවලට අනුව ශ්‍රම ඵලදයීතාවය**




**සංඛ්‍යා සටහන වි.ස. 8.1**

**නිෂ්පාදන අංශය හා ස්ත්‍රී/පුරුෂ අනුව ඌන සේවා නියුක්තිය**
**(සේවා නියුක්තියේ ප්‍රතිශතයක් ලෙස)**

| නිෂ්පාදන අංශය | 1996/97 (අ) | | | 2003/04 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | මුළු | පුරුෂ | ස්ත්‍රී | මුළු |
| කෘෂිකර්මය | 28.3 | 36.4 | 31.2 | 33.4 | 36.7 | 34.5 |
| කර්මාන්ත | 20.3 | 18.6 | 19.5 | 18.4 | 22.3 | 20.2 |
| සේවා | 21.1 | 16.8 | 20.0 | 18.0 | 17.3 | 17.8 |
| සමස්ථ | 23.5 | 25.6 | 24.2 | 23.0 | 25.4 | 23.7 |

(අ) උතුර හා නැගෙනහිර පළාත් හැර
(ආ) කිලිනොච්චි, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්ක හැර

මූලය : පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.17 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| **2004** | **44** | **15,832** | **40,779** | **46** | **17,514** | **40,321** |
| **2005 (අ)** | **17** | **4,283** | **8,370** | **40** | **49,282** | **149,982** |
| පළමු කාර්තුව | 3 | 278 | 1,144 | 12 | 43,413 | 132,664 |
| දෙවන කාර්තුව | 6 | 1,074 | 1,666 | 14 | 2,810 | 7,918 |
| තෙවන කාර්තුව | 4 | 1,627 | 3,607 | 8 | 1,524 | 3,797 |
| සිව්වන කාර්තුව | 4 | 1,304 | 1,953 | 6 | 1,535 | 5,603 |

(අ) තාවකාලික

මූලය : කම්කරු දෙපාර්තමේන්තුව

ආරක්ෂක සේවා යන අංශවලට මෙම පනත ක්‍රියාත්මක කිරීම 2006 ජනවාරි දක්වා මාස 6 කින් පමාකිරීමට කම්කරු සබඳතා හා විදේශ රැකියානියුක්ති අමාත්‍යාංශය විසින් අවසර දෙන ලදි. තවද, සාමූහික ගිවිසුම්වලට එළඹී කළමනාකරණ සමාගම් 22 යටතේ වූ සියලුම වතු, මෙම පනතට අදාළ නියෝග වලින් බැහැර කරන ලදි.

- **කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත, කම්කරු ආරවුල් පනතේ විධිවිධාන යටතේ පැවරී ඇති බලය අනුව වැවිලි අංශයේ වූ සාමූහික ගිවිසුම්, වැටුප් මණ්ඩල වලින් ආවරණිත තේ සහ රබර් වගා කිරීම හා එම නිෂ්පාදන වෙළඳාමෙහි යෙදෙන වැවිලි ආයතන සාමූහික ගිවිසුම් යටතට ගැනීමෙන් තවදුරටත් ව්‍යාප්ත කරන ලදි.** මෙම වැවිලි සමාගම්වල සේවකයන්, සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ ව්‍යවස්ථාපිත නියෝග වලින් බැහැර වුවද, නව සාමූහික ගිවිසුම්වලට එළඹීම නිසා ඔවුන්ගේ දෛනික වැටුප් රුපියල් 135 සිට රුපියල් 200 දක්වා වැඩිවීම වාසිදායක විය. මෙයට අමතරව, තොරතුරු තාක්ෂණ අංශයට සම්බන්ධිත කාන්තාවන්ගේ රාත්‍රී වැඩමුර සඳහා ඇති සීමාකිරීම් අවලංගු කිරීමට අදාළව කඩසාප්පු හා කාර්යාල පනතට සංශෝධන ගෙනඒම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදි. මෙම සංශෝධනයන් ඉතා ඉක්මණින් පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීමට නියමිතය.

- **කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශය, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගයද ඇතිව කර්මාන්තශාලා පමණක් ආවරණය වූ කර්මාන්ත ශාලා ආඥපනත (1942), සියලුම සේවා ස්ථාන ආවරණය වන පරිදි සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක නියුක්තව සිටී.** සංශෝධිත පනත වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය පනත වශයෙන් නම් කෙරේ. තවද, 2006 වර්ෂයේ අයවැය යෝජනාවලට අනුව, ශ්‍රම වෙළඳපොලේ සියලුම පාර්ශ්වකරුවන්ගේ වගකීම් පිළිබඳව අධ්‍යයනයන් ලබාදීමේ අරමුණෙන්, කම්කරු සබඳතා හා රැකියා නියුක්ති අමාත්‍යාංශය විසින් කම්කරු අධ්‍යයන ආයතනයක් පිහිටුවීමට සැළසුම් කර ඇත.

## 4.5 ප්‍රතිපත්ති හා ගැටලු

- **මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව මහජනතාවට මාසිකව සංනිවේදන කිරීම, වර්ෂය අවසාන වනවිට සාමාන්‍ය උද්ධමන තත්ත්වයත් වෙත උද්ධමන අපේක්ෂාවන් යොමු කිරීමට උපකාරී විය.** වර්ෂය ආරම්භයේදී පුරෝකථනය කළ මට්ටම් ඉක්මවා රාජ්‍ය අංශයට සහ පෞද්ගලික අංශයට දෙනු ලැබූ ණය ප්‍රසාරණය නිසා ඇති වූ අධි ඉල්ලුම් තත්ත්වය තුළින් මිල ගණන් කෙරෙහි ඇති වූ පීඩනය, මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රමයෙන් ලිහිල් කිරීම සහ විවට වෙළඳපොළ කටයුතු දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමත් සමග සීමා කිරීමට සමත් විය.

- **උද්ධමනය සහ සේවා වියුක්තිය මත වන පීඩනය අඩුවීමේ සලකුණු පෙන්නුම් කරමින්, මෑතකදී ඇතිවූ වර්ධන වේගය දිගටම පවත්වා ගැනීමට 2005 වර්ෂයේදී ආර්ථිකය සමත්විය.** කෙසේ වුවද, ප්‍රධාන ආයෝජන, අන්තර් සහ පාරිභෝජන ආනයන භාණ්ඩවල ජාත්‍යන්තර මිල මට්ටම් ඉහළ යාමට එරෙහිව මිල ස්ථායීතාවය අරමුණු කොටගත් දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල වර්ෂය අවසාන භාගය වනවිට පෙන්නුම් කිරීම ආරම්භ විය.

- **වසර පුරා පවත්වාගෙන ගිය ඉන්ධන මිලකරණ ප්‍රතිපත්තිය, පාරිභෝගිකයන්ට කෙටිකාලීන වශයෙන් සහනයක් ලබා දුන්නද, එමගින් රාජ්‍ය මූල්‍ය සම්පත් මත පීඩනයක් ඇති කළ හැකි අතර, ඒ හේතුවෙන් මැදිකාලීන හා දිගුකාලීන මිල ස්ථායීතාවය ඇතිකර ගැනීම සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපෑම් ඇතිවිය හැකිය.** ඇතැම් ඉන්ධන මිල ගණන් ජාත්‍යන්තර මිල මට්ටම්වලට වඩා අඩුවෙන් පවත්වා ගැනීම සහ තෝරාගත් පාරිභෝගික සහ අන්තර් ආනයන භාණ්ඩ කීපයක් මත එකතුකළ අගය මත වන බද්ද (VAT) ඉවත් කිරීම තුළින් මිල මට්ටම් මත වන පීඩනය අඩු වුවද, එමගින් රාජ්‍ය වියදම් සහ ආදායම් උත්පාදනය යන දෙපාර්ශවයටම අහිතකර බලපෑම් ඇතිවිය හැකිය. එසේම, පිරිවැය ඉහළයාම හමුවේ එම අයිතමයන් කාර්යක්ෂමව පරිභෝජනය කිරීම සම්බන්ධයෙන් විය හැකිව තිබූ පාරිභෝජන රටාවේ හැඩ ගැස්මද මෙම තාවකාලික සහනය නිසා වැලකී ගියේය.

- **ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන්වල හැසිරීම සහ ඒ හා සම්බන්ධව ඇති පුරෝකථනයන්, ඉන්ධන මිල ගණන් ඉදිරියේ දී පහත බැසීමේ හැකියාවක් පෙන්නුම් නොකරයි.**

ඒ අනුව, දැනට පවත්නා ඉහළ ඉන්ධන මිල ගණන් තාවකාලික සංසිද්ධියක් නොවේ. මේ තත්ත්වය යටතේ ශ්‍රී ලංකා ආර්ථිකයට ඇතිවිය හැකි අයහපත් බලපෑම් වලට විසඳුම් සෙවීමට නම් දිගුකාලීන ප්‍රතිපත්තීන් අවශ්‍යය. ජාත්‍යන්තර මිල වෙනස්වීම් දේශීය මිල මට්ටම් වෙතින් පිළිඹිබු නොවේ නම්, සමාජයට දිගුකාලීනව දැරීමට සිදුවන ශුද්ධ පිරිවැය පිළිබඳව මහජන අවබෝධය දුර්වල වන අතරම පිරිවැය කාර්යක්ෂම ඉන්ධන ප්‍රතිපත්තීන් හඳුන්වා දීමේදී පෞද්ගලික වාසි සලකන සමහර කණ්ඩායම් වෙතින් එල්ලවන ප්‍රතිරෝධයන් මැඩලීම සඳහා මහජනතාවගෙන් ලැබෙන සහයෝගය ද අඩුවීමට හේතු වේ.

- **රජයේ ප්‍රතිපත්තිය අනුව රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීමත් සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත (BRAWA) මගින් පෞද්ගලික අංශයේ වැටුප් වැඩිකිරීම අනිවාර්ය කිරීමත් හේතුවෙන් ඉහළ නගින ජීවන වියදමට එරෙහිව වැටුප් ලබන්නන්ට කිසියම් සහනයක් ලැබිය හැකිව තිබුණි**. එහෙත් රාජ්‍ය අංශයේ වැටුප් වැඩිකිරීම කාර්යක්ෂමතාවේ වර්ධනයත් සමඟ සම්බන්ධ නොකරන්නේ නම් වැටුප් වැඩිකිරීම නිසා ඇතිවන බලපෑම් මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ මිල ස්ථායීතාවය ඇතිකර ගැනීමේ අරමුණු නිශේදනය වීමට ඉඩ තිබේ. එසේම BRAWA අනුව ඉහළ යන ජීවන වියදම හමුවේ ප්‍රතිපත්තියක් ලෙස නිතිපතා වැටුප් වැඩිකිරීම පෞද්ගලික අංශයේ ලාභදායිත්වයට අහිතකර ලෙස බලපාන්නට ඇත. එය පෞද්ගලික අංශයේ තීරණ ගැනීමේ විෂය පථයට කරන ලද අහිතකර බලපෑමක් ලෙස පෙනීයනු ඇත. මෙය ආර්ථිකය තුළ ඵලදායිතාවය පදනම් වූ වැටුප් වැඩි කිරීමේ ප්‍රතිපත්තියක් ඇති කිරීමේ ප්‍රයත්නය හා නොගැළපෙනු ඇත.
- **කම්කරු සබඳතා වල නම්‍යශීලත්වය සහ ස්ථාවර ප්‍රතිපත්ති ආයෝජන හිතෛෂී පරිසරයක් ඇතිකිරීම සඳහා වන මූලික කරුණු වේ**. මෙවැනි වාතාවරණයක්, ඵලදායිතාවයේ අඛණ්ඩ වර්ධනයක් තුළින් ජාත්‍යන්තර තරඟකාරිත්වය වැඩිකිරීම සඳහා උපකාරී වේ. සේවය අවසන් කිරීමේ පනත (TEWA) යටතේ ඇති වන්දි සූත්‍රය වෙනස් කිරීම, සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත තුළින් ඇතිකළ පෞද්ගලික අංශයේ අනිවාර්ය වැටුප් වැඩිකිරීම් සහ රාජ්‍ය ආයතනවල ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වැඩපිළිවෙල අත්හිටුවීම ආදී නව ප්‍රතිපත්තිමය වෙනස්කම් කලින් තිබූ ශ්‍රම වෙළඳපොලෙහි නම්‍යශීලීතාවය ඉහළයාමට ඉවහල් වූ ප්‍රතිපත්තීන්ට ප්‍රතිවිරුද්ධ වීම දේශීය හා විදේශීය ආයෝජකයන් හට ඇතැම්විට ප්‍රත්‍යක්ෂ විය හැක. මෙමගින් ඇතිවිය හැකි ඍණාත්මක හැඟීම් මඟහැරීමට ආයෝජකයන් සමඟ කෙරෙන සාකච්ඡා දිගුකාලීනව උපකාරී වේ.
- **රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ප්‍රත්පත්ති යටතේ ක්‍රියාත්මක කරන ලද උපාධිධාරී රැකියා වැඩසටහන, 2005 වර්ෂය තුළදී උගත් තරුණ කොටස්වල සේවා වියුක්තිය පහළ හෙළීමට හේතුවිය**. තවද, 2006 වර්ෂය තුළදී යොවුන් දිරිය වැඩසටහන යටතේ රාජ්‍ය අංශයේ තවත් ඇබෑර්තු 10,000 ක් සඳහා නවක උපාධිධාරීන් බඳවාගැනීමට යෝජිතය. මෙමගින් උසස් අධ්‍යාපන සුදුසුකම් සහිත, නව කාර්ය බලකායක් තුළින් සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණුකොට, සමස්ථ රාජ්‍ය අංශය ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වේ. තවද, මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීම මගින් ශ්‍රම වෙළඳපොලෙහි උගත් තරුණ පිරිස්වල විරැකියා ප්‍රශ්නය අවම කිරීමට විශේෂයෙන් දිගුකලක් සිට පැවති උපාධිධාරී විරැකියා ප්‍රශ්නය විසඳීමට රජය උත්සාහ ගන්නා ලදි. 2004 හා 2005 වර්ෂවලදී පුහුණුකොට බඳවාගත් 42,000 ක් වූ උපාධිධාරීන්ට අමතරව තවත් උපාධිධාරීන් 10,000 ක් 2006 වර්ෂය තුළදී බඳවා ගැනීම මගින් අපේක්ෂිත ඵලදායිතා සහ කාර්යක්ෂමතා ඉලක්කයන් ඉටු නොවුනහොත්, එමගින් අයවැය සම්පත් කෙරෙහි දිගුකාලීනව දැඩි බරක් පැටවෙනු ඇත.
- **නව ප්‍රතිපත්තිමය යෝජනා විදේශ රැකියා සඳහා අපේක්ෂාවන් ඉහළ නංවා. ඒ තුළින් ඉදිරියේදී විදේශ රැකියා සඳහා පිටත්වීම් වැඩි කිරීමට බලාපොරොත්තු වේ**. මෙම යෝජනා යටතේ රජය විශේෂ පුහුණුවීම් මධ්‍යස්ථාන පිහිටවනු ඇත. තවද, දීර්ඝ කාලයක් විදේශ රැකියාවන්හි යෙදීම සඳහා වන දිරිගැන්වීමක් ලෙස අවුරුද්දක් හෝ ඊට වැඩි කාලයක් විදේශ රැකියාවන්හි නොකඩවා සේවයේ යෙදෙන සංක්‍රමණිකයන්ට තීරුබදු රහිත දීමනාවක් හඳුන්වා දී ඇත. එමෙන්ම, යෝජිත විදේශ රැකියා අවස්ථාවන්හි වැඩිවීම ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය තවදුරටත් ශක්තිමත් වන අතරම, අඩු සවංර්ධිත ප්‍රදේශ කරා විදේශ පෞද්ගලික ප්‍රේෂණයන් ගලායාමක්ද සිදුවේ. එහෙත් විදේශ රැකියා තුළින් ඉතිරිකිරීම් ඉහළ ගියද, සංක්‍රමණය වීම නිසා සංක්‍රමිකයන්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වලට හා සමාජයට, විවිධ සමාජ ආර්ථික ප්‍රශ්නවලට මුහුණදීමට සිදුවී ඇත. අනෙක් අතට, විදේශ විනිමය උකහාගැනීමේ ක්‍රම රටතුළම ජනනය කළ හැකි නිෂ්පාදන කටයුතු හා සේවා වර්ධනය තිරීම තුළින් වර්ධනය වන ශ්‍රම බලකාය වාසිදයක ලෙස යොදගත හැකි ලෙස ආර්ථිකය පුළුල් කළ හැකි නම්, ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණික ශ්‍රමිකයන් සැපයීම තවදුරටත් අවශ්‍ය නොවනු ඇත.
- **පුහුණු ශ්‍රමය වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ප්‍රතිපත්ති ප්‍රශංසනීය වනුයේ ඒ තුළින් ඉහල වැටුප් හා වඩාත් යහපත් සේවා කොන්දේසි සහිත උසස් කුසලතා මට්ටමක් ලබාගත හැකිවීම නිසාය**. මෙමගින් පුහුණු ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම අඩු සංවර්ධිත නාගරික නොවන ප්‍රදේශවලින් විදේශ රැකියා සඳහා පිටවී යාම තවදුරටත් ධෛර්යමත් කරනු ඇති අතර මෙය රජයේ ආර්ථික ප්‍රතිපත්ති යටතේ රට තුළින්ම අවශ්‍ය කුසලතා සහ ශ්‍රම බලකාය භාවිතයෙන් සමබර ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය තුළින් ඉලක්ක ගත සියයට 6 - 8 ආර්ථික වර්ධනයක් ලබා ගැනීම සඳහා ඇතැම් විට උපකාරී නොවේ.
- **සාරාංශ වශයෙන් ගතහොත්, දිගුකාලීන තිරසාර ඉහළ** වර්ධනයක් සඳහා ගෙන ඇති ඉහත සඳහන් කළ සියලුම ක්ෂේත්‍රයන්ට අදළ වත්මන් ප්‍රතිපත්තීන්හි අනුගතභාවය සහ බැඳීම් සහතික කරනු වස්, ඒවා නිරන්තර විමර්ශනයට ලක්කිරීම සහ යථාවත් කිරීම් කළයුතුය.